# ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය

# 2013

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

“ශ්‍රී ලංකාව කලාපයේ බලශක්ති කේන්ද්‍රයක් බවට පත්කරමු”

# පටුන


පිටු අංකය

ගරු ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගේ පණිවිඩය vii

ගරු ඛනිජ තෙල් කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය ix

පෙරවදන, ලේකම්, ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය xi

## I කොටස

1. ඛනිජ තෙල් වෙළඳම
   - 1.1 ලෝක ඛනිජ තෙල් වෙළඳම 3
   - 1.2 ශ්‍රී ලංකා ඛනිජ තෙල් කර්මාන්තය 10

## II කොටස

2. කාර්යසාධනය
   - 2.1 ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය 17
   - 2.2 ආනයන සහ පිරිපහදුව 22
   - 2.3 ගබඩා කිරීම, බෙදා හැරීම සහ අලෙවිය 25
   - 2.4 යටිතල පහසුකම් 27
   - 2.5 ආයතන පරිපාලනය 29
   - 2.6 ගිණුම් 35

3. උපග්‍රන්ථය 41

## I කොටස - වගු

පිටු අංකය


| | | |
|---|---|---|
| 1.1 වගුව | තහවුරු කරන ලද බොර තෙල් සංචිත 2009 - 2013 | 4 |
| 1.2 වගුව | තෙල් සංචිත පවත්නා ප්‍රමුඛ රටවල් - 2013 | 5 |
| 1.3 වගුව | තෙල් නිෂ්පාදනයේ ප්‍රමුඛ රටවල් - 2012 | 6 |
| 1.4 වගුව | තෙල් අපනයනයේ ප්‍රමුඛ රටවල් - 2012 | 6 |
| 1.5 වගුව | තෙල් ආනයනයේ ප්‍රමුඛ රටවල් - 2012 | 7 |
| 1.6 වගුව | තෙල් පරිභෝජනයේ ප්‍රමුඛ රටවල් - 2012 | 7 |
| 1.7 වගුව | ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර මිල 2005-2013 | 11 |
| 1.8 වගුව | ඛනිජ තෙල් නිෂ්පාදන බෙදා හැරීමේ මධ්‍යස්ථාන - 2013 | 12 |
| 1.9 වගුව | විදුලිබල නිෂ්පාදනාගාර සඳහා ලං.ඛ.නී.ස.වේ විකුණුම් 2008 - 2013 | 12 |
| 1.10 වගුව | නැව් තෙල් වෙළඳම 2008 - 2013 | 13 |


## II කොටස - වගු


| | | |
|---|---|---|
| 2.1 වගුව | ලං.ඛ.නී.ස. විසින් ආනයනය කරන ලද පිරිපහදු ඛනිජ තෙල් නිෂ්පාදන 2012-2013 | 22 |
| 2.2 වගුව | බොරතෙල් ආනයනය 2012-2013 | 23 |
| 2.3 වගුව | ලං.ඛ.නී.ස. විසින් ආනයනය කරන ලද කෘෂි රසායනික ද්‍රව්‍ය 2012-2013 | 23 |
| 2.4 වගුව | ලං.ඛ.නී.ස. විසින් ආනයනය කරන ලද තාර - 2012 | 24 |
| 2.5 වගුව | ලං.ඛ.නී.ස. විසින් ආනයනය කරන ලද තාර - 2013 | 25 |
| 2.6 වගුව | ලං.ඛ.තො.ග.ප. සමාගමේ විකුණුම් - 2013 | 26 |
| 2.7 වගුව | ලං.ඛ.නී.ස.වේ විකුණුම් 2012 - 2013 | 26 |
| 2.8 වගුව | පෙත්සම් සහ වාචික පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න පිළිබඳ සාරාංශය | 30 |
| 2.9 වගුව | අමාත්‍යාංශය විසින් ලබා දෙන ලද පුහුණු වැඩසටහන් - 2013 | 32 |
| 2.10 වගුව | දැයට කිරුළ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති - 2013 | 33 |
| 2.11 වගුව | දැයට කිරුළ වැඩසටහන යටතේ යෝජිත ව්‍යාපෘති 2014 | 33 |
| 2.12 වගුව | ලං.ඛ.තො.ග.ප. සමාගමේ සේවක සංඛ්‍යාව - 2013 | 35 |
| 2.13 වගුව | අමාත්‍ය කාර්යාල පරිපාලනය - පුනරාවර්තන වියදම් - 2013 | 35 |
| 2.14 වගුව | අමාත්‍යාංශ පරිපාලනය - පුනරාවර්තන වියදම් - 2013 | 36 |
| 2.15 වගුව | අමාත්‍ය කාර්යාල පරිපාලනය - ප්‍රාග්ධන වියදම් - 2013 | 36 |
| 2.16 වගුව | අමාත්‍යාංශ පරිපාලනය - ප්‍රාග්ධන වියදම් - 2013 | 36 |
| 2.17 වගුව | අත්තිකාරම් ගිණුමට සම්බන්ධ අනුමත සීමාවන් සහ සත්‍ය වියදම - 2013 | 37 |
| 2.18 වගුව | ලං.ඛ.නී.ස.වේ ආදායම් ප්‍රකාශය - 2013.12.31 | 37 |
| 2.19 වගුව | ලං.ඛ.නී.ස.වේ ශේෂ පත්‍රය - 2013.12.31 | 38 |
| 2.20 වගුව | ලං.ඛ.තො.ග.ප. සමාගමේ ආදායම් ප්‍රකාශය - 2013.12.31 | 39 |
| 2.21 වගුව | ලං.ඛ.තො.ග.ප. සමාගමේ ශේෂපත්‍රය - 2013.12.31 | 40 |

## I කොටස - ප්‍රස්ථාර


| | | |
|---|---|---|
| | | පිටු අංකය |
| 1.1 ප්‍රස්ථාරය | තහවුරු කරන ලද බොර තෙල් සංචිත 1980 - 2013 | 4 |
| 1.2 ප්‍රස්ථාරය | ලෝක තෙල් නිෂ්පාදනය 2008 - 2013 | 5 |
| 1.3 ප්‍රස්ථාරය | ලෝක තෙල් පරිභෝජනය 2008 - 2012 | 6 |
| 1.4 ප්‍රස්ථාරය | ආර්ථික අංශ අනුව තෙල් ඉල්ලුම - 2010 | 8 |
| 1.5 ප්‍රස්ථාරය | බොර තෙල්වල මාසික Brent මිල - 2013 | 8 |
| 1.6 ප්‍රස්ථාරය | බොර තෙල්වල වාර්ෂික Brent මිල 2000 - 2013 | 8 |
| 1.7 ප්‍රස්ථාරය | විවිධ වෙළඳපොළවල බොර තෙල්වල මාසික මිල හැසිරීම - 2013 | 9 |
| 1.8 ප්‍රස්ථාරය | පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදනවල Platts මාසික මිල - 2013 | 9 |
| 1.9 ප්‍රස්ථාරය | පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදනවල Platts මිල 2002 - 2013 | 9 |
| 1.10 ප්‍රස්ථාරය | පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන 2007 - 2013 | 10 |
| 1.11 ප්‍රස්ථාරය | ද්‍රවීකෘත වායු ආනයන 2007 - 2013 | 10 |
| 1.12 ප්‍රස්ථාරය | ලිහිසි තෙල් ආනයන 2007 - 2013 | 10 |
| 1.13 ප්‍රස්ථාරය | ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර මිල 2005 - 2013 | 11 |


## APPENDIX-TABLES


| | | |
|---|---|---|
| Table A | World Proved Reserves of Crude Oil 1980 - 2013 | 43 |
| Table B | World Oil Production 2008 - 2013 | 43 |
| Table C | World Oil Consumption 2008 - 2012 | 43 |
| Table D | Monthly Brent Price of Crude Oil - 2013 | 44 |
| Table E | Annual Brent Price of Crude Oil 2000 - 2013 | 44 |
| Table F | Monthly Price of Crude Oil in Different Markets - 2013 | 44 |
| Table G | Monthly Platts Price of Refined Petroleum Products - 2013 | 45 |
| Table H | Platts Price of Refined Petroleum Products 2002 - 2013 | 46 |
| Table I | Refined Petroleum Products Imports 2007 - 2013 | 47 |
| Table J | Liquid Petroleum Gas (LPG) Imports 2007 - 2013 | 47 |
| Table K | Lubricants Imports 2007-2013 | 47 |
| Table L | Price Revisions of Petroleum Products 2005 - 2013 | 48 |
| Table M | Oil Production by CPC's Refinery 2000 - 2013 | 50 |
| Table N | CPC's Sales to Power Plants 2008 - 2013 | 51 |
| Table O | Ministry's Expenditure 2006 - 2011 | 52 |

# ගරු ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගේ පණිවිඩය



ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය ඒ යටතේ ක්‍රියාත්මක වන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම යන ආයතන දෙක හා එක්ව ක්‍රියාත්මක කරන ලද කාර්යයන්හි ප්‍රගතිය ඇතුළත් " 2013 වාර්ෂික කාර්යසාධන වාර්තාව " නමැති මෙම ප්‍රකාශනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ලැබීම ඉතාමත් සතුටට කාරණයකි. අමාත්‍යාංශය සහ එහි ආයතන විසින් රටේ ඛනිජ තෙල් නිෂ්පාදන අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා 2013 වර්ෂයේ දී ඉටු කරනු ලැබූ සේවාවන් පිළිබඳව තොරතුරු මෙම වාර්තාව මගින් ඉදිරිපත් කර ඇත.

මේ වන විට ශ්‍රී ලංකාවේ දියත් කර ඇති සීඝ්‍ර සංවර්ධන වැඩසටහන් සමඟ පාරිභෝගික ඉන්ධන අවශ්‍යතාවය ඉහළ ගොස් ඇත. ශ්‍රී ලංකාව තවමත් ඛනිජ තෙල් නිෂ්පාදනය කරන රටක් නොවන අතර සමස්ත ඉන්ධන අවශ්‍යතාවය ආනයන මත පදනම් වී ඇත. මෙසේ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය ආර්ථික වශයෙන් අභියෝගයක් වුවද ජනතාවගේ එදිනෙදා ජීවිතයේ අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩයක් බවට පත් වීම හේතුවෙන් ආනයනය, පිරිපහදුව, සහ බෙදා හැරීම පිළිබඳ කාර්යයන් මනාව කළමනාකරණය කිරිමට සිදු වී ඇත.

ශතවර්ෂ අර්ධයකටත් අධික කාලයක් තිස්සේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඛනිජ තෙල් කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලෙමින් සිටී. කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් පාරිභෝගිකයින්ට ලබා දීම තුළින් වර්තමානය වන විට 80%ක සාමාන්‍ය වෙළඳපොළ කොටසක් පවත්වාගෙන යාමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හැකි වී ඇත. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට මෙම තත්වය ළඟා කර ගැනීම පිණිස ඛනිජ තෙල් ගබඩා කිරීම හා දිවයින පුරා බෙදා හැරීම තුළින්  ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම මහඟු දායකත්වයක් ලබා දෙයි. මෑත කාලයේදී ලෝක තෙල් වෙළඳපොළේ මිල ගණන් ඉහළ ගියද, වර්ෂය පුරා ස්ථාවර මිල ගණන් පවත්වා ගැනීමට ආයතන දෙකද සමඟ එක්ව මාගේ අමාත්‍යාංශයට හැකි වී ඇත.

2014 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔක්ටේන් 90 පෙට්‍රල් වෙනුවට ඔක්ටේන් 92 පෙට්‍රල් දිවයින පුරා බෙදා හැරීමට තීරණය කිරීම අමාත්‍යාංශය විසින් 2013 වර්ෂයේදී ගනු ලැබූ එක් ප්‍රධාන ප්‍රතිපත්තිමය තීරණයකි. අමාත්‍යාංශයේ මග පෙන්වීම යටතේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් මේ සඳහා අවශ්‍ය සියළු කටයුතු 2013 දෙසැම්බර් 31 දින වන විට සිදු කරන ලදී. රටේ ආර්ථික හා පාරිසරික සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා ඛනිජ තෙල් කර්මාන්තය මගින් ඍජු දායකත්වක් ලබා දීම මෙමගින් අපේක්ෂා කෙරේ.

මීට අමතරව වර්තමාන රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව වන"ශ්‍රී ලංකාව - ආසියාවේ ආශ්චර්යය-මහින්ද චින්තන, ඉදිරි දැක්ම" තුළින් ඉදිරිපත් කර ඇති ඉලක්කයන් යථාර්ථයක් කිරීමේ අරමුණින් වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇත. ඉහළ ගුණත්වයෙන් යුත් ඛනිජ තෙල් නිෂ්පාදන පාරිභෝගිකයින්ට ලබා දීමේ අරමුණින් ඛනිජ තෙල් නිෂ්පාදන පිළිබඳ පිරිවිතර සංශෝධනය කරනු ලැබූ අතර එම නිෂ්පාදන පරීක්ෂා කරනු ලබන රසායනාගාර පහසුකම් ද වැඩිදියුණු කරන ලදී. එසේම දිගු කාලීන කොන්ත්‍රාත්තු මත පදනම්ව තෙල් මිලදී ගැනීමටත් ඛනිජ තෙල් කර්මාන්තයේ පවත්නා වෙළඳපොළ තරගකාරීත්වයට මුහුණ දෙමින් ආදායම් උත්පාදනය වර්ධනය කිරීමේ අරමුණින් වෙළඳපොළ ව්‍යාප්තියටත් අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

මෙම වර්ෂය තුළ අමාත්‍යාංශයට සාර්ථක කාර්යසාධනයක් පෙන්වීම සඳහා මා හට ලබා දුන් සහයෝගය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමන්ට, අමාත්‍යාංශයේ ලේකම්තුමන්ට සහ අනෙකුත් නිලධාරීන්ට, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ සභාපතිවරුන් දෙපළ ඇතුළු අනෙකුත් නිලධාරීන්ට මාගේ හද පිරි කෘතවේදීත්වය ප්‍රකාශ කරමි.

**අනුර ප්‍රියදර්ශන යාපා, පා.ම.**
**ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍ය**

# ගරු ඛනිජ තෙල් කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය



ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය විසින් සක්සකර ඇති " 2013 වාර්ෂික කාර්යසාධන වාර්තාව " නමැති ප්‍රකාශනය සඳහා පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම සතුටට කරුණකි.

ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් අවශ්‍යතාව සම්පූර්ණයෙන්ම ආනයනය කිරීම තුලින් සපුරා ගනු ලබයි. එබැවින් ලෝක තෙල් සැපයුමේ පවත්නා අස්ථාවරතා සහ මිල උච්ඡාවචනයන් හේතුවෙන් අභියෝගයන් රැසකට මුහුණ දීමට සිදු වී ඇත. කෙසේවුවද, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම හා එක්ව අමාත්‍යාංශය විසින් රටේ ඛනිජ තෙල් අවශ්‍යතාව අඛණ්ඩව සපුරාලීමට කටයුතු කර ඇත.

අමාත්‍යාංශය එහි ආයතන දෙකෙහි සහයෝගය ඇතිව පාරිභෝගික ඉන්ධන අවශ්‍යතාව කාර්යක්ෂමව හා ඵලදායීව සපුරාලීම සඳහා අවශ්‍ය සේවාවන් ඉටුකිරීමට අමතරව දේශීය ඛනිජ තෙල් කර්මාන්තය නංවාලීම සඳහා ද අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණයන් රාශියක් ගෙන ඇති අතර ඒ සඳහා වැඩසටහන්ද දියත් කර ඇත.

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම මගින් ඛනිජතෙල් නිෂ්පාදන දිවයින පුරා කිසිදු බාධාවකින් තොරව බෙදාහැරීමටත් ලාභදායී ව්‍යාපාරයක් ලෙස සැලකිය හැකි නැව්තෙල් අංශය සාර්ථකව මෙහෙයවීමටත් හැකි වී තිබේ. ලංකා ඛනිජතෙල් නිතිගත සංස්ථාව විසින් ලිහිසිතෙල් සහ තාර නිෂ්පාදන අංශ නගා සිටුවීමටත් ගුණාත්මකභාවයෙන් යුතු උසස් තත්වයේ ඉන්ධන පාරිභෝගිකයාට ලබාදීමටත් පියවර ගෙන ඇත. එමෙන්ම තත්වයෙන් උසස් නිෂ්පාදන පාරිභෝගික ජනතාවට ලබාදෙනු වස් අපගේ රසායනාගාර නවීන තාක්ෂණයෙන් බලගැන්වීමට පියවර ගෙන තිබේ. ඛනිජතෙල් කර්මාන්තය තුළ පාරිභෝගික හිතෛෂී කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීම තහවුරු කරමින් ඛනිජතෙල් කර්මාන්ත ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා කටයුතු කරන ගරු ඛනිජතෙල් කර්මාන්ත අමාත්‍ය අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමන් කෘතඥතා පූර්වකව මෙහිදී සිහිපත් කරමි.

අවසාන වශයෙන් කවර අභියෝගයක් පැවතිය ද මෙරට ඛනිජ තෙල් කර්මාන්තයේ උන්නතිය, ජාතික සංවර්ධනය සහ ජනතා සුභසිද්ධිය උදෙසා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම එක්ව ගත යුතු වන ඕනෑම පියවරක් අවංකව, නොබියව, ධෛර්ය සම්පන්නව ගනු ලැබීමට පසුබට නොවන බවත් සඳහන් කරනු කැමැත්තෙමි.

**සරණ ගුණවර්ධන, පා.ම.**
**ඛනිජතෙල් කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍ය**



# පෙරවදන

සෑම රාජ්‍ය අයතනයක් විසින්ම පසුගිය වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද කාර්යයන්හි ප්‍රගතිය ඇතුළත් වාර්ෂික වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වේ. ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, අපනයනය, පිරිපහදු කිරීම, ගබඩා කිරීම සහ බෙදා හැරීම යන කාර්යයන්ට අදාළ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ ප්‍රධාන ආයතනයක් වශයෙන් ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය විසින් ඉහත අවශ්‍යතාවය උදෙසා " 2013 වාර්ෂික කාර්යසාධන වාර්තාව " නමැති ප්‍රකාශනය ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාව ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වන අතර පළමු කොටස ලෝකයේ හා ශ්‍රී ලංකා ඛනිජ තෙල් කර්මාන්තය පිළිබඳ මූලික තොරතුරු ඇතුළත් විශ්ලේෂණයකින් සමන්විත වේ. මෙම තොරතුරු අන්තර්ජාලය සහ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, ලංකා ඉන්දියානු තෙල් සමාගම, ලාෆ් ගෑස් පීඑල්සී සමාගම සහ ලිට්රෝ ගෑස් සමාගම යනාදී ආයතනවලින් ලබා ගන්නා ලදී.

2013 වර්ෂය තුළදී අමාත්‍යාංශය සහ එහි ආයතන වන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් ක්‍රියාත්මක කරන ලද කාර්යයන්හි ප්‍රගතිය පිළිබඳ තොරතුරු දෙවන කොටස මගින් ඉදිරිපත් කර ඇත. කාර්යසාධනය පිළිබඳ තොරතුරු 2010.04.30 දිනැති අංක 1651/20 දරණ රජයේ අති විශේෂ ගැසට් නිවේදනයේ සඳහන් පරිදි අමාත්‍යාංශයට පැවරී ඇති විෂය පථයට අනුව ඉදිරිපත් කර ඇත.

පළමු කොටසෙන් ඉදිරිපත් කරනු ලබන ලෝකයේ හා ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් කර්මාන්තය පිළිබද තොරතුරුවලට අමතරව වැඩිමනත් දත්ත හා තොරතුරු මෙම වාර්තාව අවසානයේ දැක්වෙන උපග්‍රන්ථය මගින් ඉදිරිපත් කර ඇති අතර මෙම දත්ත වාර්ෂිකව තවදුරටත් යාවත්කාලීන කිරීමට බලාපොරොත්තු වෙමි.

**ආර්.එච්.එස්. සමරතුංග**
**ලේකම්**
**ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය**

# ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය

## දැක්ම

"පසුභාග ඛනිජ තෙල් කර්මාන්ත කළමනාකරණයේ සාර්ථකත්වය සහ නිර්මාණශීලීතාව සම්බන්ධව කලාපයේ ඇගයීමට භාජනය වීම"

## මෙහෙවර

"යෝග්‍ය ප්‍රතිපත්ති සහ නිර්මාණශීලී කළමනාකරණ ක්‍රමවේදයන් උපයෝගී කර ගනිමින් කලාපයේ වඩා කාර්යක්ෂම ඛනිජ තෙල් බලශක්ති කේන්ද්‍රය බවට පත් වීම"

## අමාත්‍යාංශයේ අරමුණු

තිරසාර සහ කාර්යක්ෂම ලෙස ඛනිජ තෙල් කර්මාන්තය කළමණාකරණය සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.

නූතන තාක්ෂණයට අනුගත කිරීම තුළින් පාරිභෝගිකයන්ගේ බලශක්ති අවශ්‍යතා සැපයීමෙන් ඔවුනට සතුටුදායක සේවයක් සැපයීම.

## අමාත්‍යාංශය වෙත පැවරී ඇති බලතල, රාජකාරි සහ කාර්යයන්
## (2010 අප්‍රේල් 30 දිනැති අංක 1651/20 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාර)

- ❖ මහින්ද චින්තන ඉදිරි දැක්ම සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ඛනිජ තෙල් කර්මාන්ත විෂයයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම.
- ❖ අදාළ අරමුණු ළඟා කර ගැනීම සඳහා ඉහත ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති ඉලක්ක ගත අයුරින් ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම.
- ❖ අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂම හා මහජන මිත්‍රශීලී අයුරින් ලබා දීම.
- ❖ කාර්යක්ෂම ලෙස ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන බවට සහතික කරනු වස් සියලුම පද්ධති සහ කාර්යය පටිපාටීන් ප්‍රතිසංස්කරණය කරමින් දූෂණය සහ නාස්තිය පිටුදකිමින් අදාළ වන පරිදි නවීන කලමනාකරණ තාක්ෂණ ක්‍රමවේදයන් යොදා ගැනීම.
- ❖ ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන සහ ස්වභාවික වායු ආනයනය කිරීම, පිරිපහදු කිරීම, ගබඩා කිරීම, බෙදා හැරීම සහ විකිණීම.
- ❖ ඛනිජ තෙල් ආශ්‍රිත නිපැයුම් නිෂ්පාදනය කිරීම සහ පිරිපහදු කිරීම.
- ❖ ඛනිජ තෙල් ආශ්‍රිත නිපැයුම් වැනි ප්‍රභවවලින් ගෑස් නිෂ්පාදනය කිරීම සහ බෙදා හැරීම.
- ❖ ඉන්ධන සැපයීම හා බෙදා හැරීමට අදාළ වන යටිතල පහසුකම් සංවර්ධය කිරීම.

## අමාත්‍යාංශය යටතේ පවත්නා ප්‍රධාන අංශ

- ❖ ආයතන හා පරිපාලන අංශය
- ❖ සංවර්ධන අංශය
- ❖ මූල්‍ය අංශය
- ❖ ප්‍රසම්පාදන අංශය
- ❖ අභ්‍යන්තර විගණන අංශය

## අමාත්‍යාංශයේ විෂය පථයට ගැනෙන ආයතන

2010 අප්‍රේල් මස 30වන දිනැති අංක 1651/20 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාර, පහත සඳහන් ආයතන ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය වෙත පැවරී ඇත.

- ❖ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ( Ceylon Petroleum Corporation )
- ❖ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම ( Ceylon Petroleum Storage Terminals Ltd )

# සංවිධාන ව්‍යුහය


ලේකම්
අතිරේක ලේකම් (පාලන)
අතිරේක ලේකම් (සංවර්ධන)
අතිරේක ලේකම් (ප්‍රසම්පාදන)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංවර්ධන)
අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන)
ප්‍රධාන ගණකාධිකාරී
ප්‍රධාන අභ්‍යන්තර විගණක
සහකාර ලේකම් (පාලන)
සහකාර ලේකම් (සංවර්ධන)
සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)
සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන)
ගණකාධිකාරී
නීති නිලධාරී

## අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය - 2013.12.31 දිනට

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | |
| ලේකම් | 01 | 01 | - |
| අතිරේක ලේකම් | 03 | 02 | 01 |
| ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 | - |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 02 | 02 | - |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 01 | 01 | - |
| අධ්‍යක්ෂ | 01 | - | 01 |
| සහකාර ලේකම් | 02 | 02 | - |
| සහකාර අධ්‍යක්ෂ | 02 | 01 | 01 |
| ගණකාධිකාරී | 01 | 01 | - |
| නීති නිලධාරී | 01 | - | 01 |
| එකතුව | **15** | **11** | **04** |
| **ද්විතියික මට්ටම** | | | |
| පරිපාලන නිලධාරී | 01 | 01 | - |
| භාෂා පරිවර්තක | 01 | - | 01 |
| එකතුව | **02** | **01** | **01** |
| **තෘතියික මට්ටම** | | | |
| සංවර්ධන සහකාර | 20 | 18 | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 27 | 19 | 08 |
| තොරතුරු තාක්ෂණ සහකාර | 02 | 01 | 01 |
| ලේකම්තුමාගේ සම්බන්ධීකරණ ලේකම් | 01 | 01 | - |
| නිශ්චල ඡායාරූප ශිල්පී | 01 | - | 01 |
| වීඩියෝ කැමරාකරු | 01 | 01 | - |
| එකතුව | **52** | **40** | **12** |
| **ප්‍රාථමික මට්ටම** | | | |
| රියදුරු | 13 | 11 | 02 |
| කැමරා සහායක | 01 | 01 | - |
| කාර්යාල කාර්ය සහායක | 13 | 08 | 05 |
| එකතුව | **27** | **20** | **07** |
| **මුළු එකතුව** | **96** | **72** | **24** |

# I කොටස

# ඛනිජ තෙල් වෙළඳාම

# 1 ඛනිජ තෙල් වෙළඳම

## 1.1 ලෝක ඛනිජ තෙල් වෙළඳම

### 1.1.1 හැඳින්වීම

2012 වර්ෂයේ දී ලෝක බලශක්ති ඉල්ලුමෙන් 87% ක් සපුරන ලද්දේ ෆොසිල ඉන්ධනවලිනි. එය වැදගත් වන්නේ ප්‍රවාහනය කළ හැකි බලශක්ති මූලාශ්‍රයක් වශයෙන් බහුතරයක් වාහනවලට සහ බොහෝ කර්මාන්තවලට අවශ්‍ය රසායනික ද්‍රව්‍යයක් ලෙස භාවිතා කළ හැකි බැවිනි. ප්‍රමාණය සහ වටිනාකම අනුව ඛනිජ තෙල් ජාත්‍යන්තර වෙළඳපොළේ විශාලතම වෙළඳ භාණ්ඩය බවට පත් වී ඇත. ඛනිජ තෙල් නිෂ්පාදනය/ අපනයනය සහ පරිභෝජනය/ ආනයනය කරන රටවල ජාතික ආර්ථිකයට ඛනිජ තෙල් විශාල වශයෙන් බලපෑම් ඇති කරයි. ඉහතින් දක්වන ලද රටවල් කාණ්ඩ දෙකෙහි හා ජාත්‍යන්තර ප්‍රජාවගේ දේශපාලන ස්ථායීතාව සහ ආර්ථික පැවැත්ම බොහෝ දුරට රඳා පවතින්නේ ජාත්‍යන්තර වෙළඳපොළේ ඇති ඛනිජ තෙල් ප්‍රමාණය සහ ඒවා මිල දී ගැනීමට ඇති ශක්තිය මතය. බොහෝ ගෝලීය ආර්ථික අවපාතයන් සඳහා ඉහළ ඛනිජ තෙල් මිල ගණන් බලපා ඇති බවට විශ්වාස කරනු ලැබේ.

ඛනිජ තෙල් නිෂ්පාදනය සඳහා වන වෙළඳපොළ ලෝකය පුරා පැතිරී පවතින අතර එය පහසුවෙන් කඩා වැටෙන සුළුය. ලෝකයේ කිසිදු රටකට ඛනිජ තෙල් නිෂ්පාදනය කරන ප්‍රධාන කලාපය වන මැදපෙරදිග කලාපයෙන් බැහැරව කටයුතු කළ නොහැකිය. කිසියම් රටක් මැද පෙරදිග රටවලින් එකදු තෙල් බිඳක්වත් ආනයනය නොකළද එම කලාපයේ සිදු වන කිසියම් හෝ ගැටළුකාරී තත්වයක් ලෝකයේ අනෙකුත් කලාපයන්හි ඛනිජ තෙල් මිල කෙරෙහි බලපෑම් ඇති කරයි.

**බලශක්ති උත්පාදනයේ වැදගත් ප්‍රභවයක් වන තෙල් පොතු ගල්**

ඇමරිකා එක්සත් ජනපදය සහ කැනඩාව විසින් තෙල් පොතු ගල් සොයා ගැනීමත් සමඟ ස්වභාවික වායුන් බලශක්ති උත්පාදනය සඳහා භාවිතය පිළිබඳ ලෝක අවධානය වඩාත් යොමු විය. ස්වභාවික වායුවල මිල ගණන් සාපේක්ෂ වශයෙන් පහළ අගයක් ගැනීම හේතුවෙන් ඇමරිකා එක්සත් ජනපදය විසින් බලශක්ති උත්පාදනය සඳහා ඒවා බහුලව යොදා ගනු ලබයි. එසේම ප්‍රවාහන අංශය සඳහා ද ස්වභාවික වායුන් යොදා ගැනීම සම්බන්ධවත් දැඩි අවධානයක් යොමු වී ඇත. විශාල වශයෙන් තෙල් පොතුගල් නිධි පැවතියත් එසේම එමගින් විශාල වශයෙන් ස්වාභාවික වායු උත්පාදනය කරනු ලැබුවත් කෙටි කාලීනව හා දිගුකාලීනව තෙල් පොතුගල්වලින් ස්වාභාවික වායු අඛණ්ඩව නිෂ්පාදනය කිරීම සඳහා දැඩි බාධා එල්ල වී ඇත. අධික ජල භාවිතය, අප ජලය බැහැර කිරීම සහ අහිතකර පාරිසරික බලපෑම් මෙම බාධාවන් අතර ප්‍රධාන තැනක් ගනී. කෙසේවුවද, තෙල් පොතු ගල් මගින් ඉන්ධන උත්පාදනයේ දී ඇතිවන මෙම අහිතකර බලපෑම් පිළිබඳ අවධානය ක්‍රමයෙන් අඩුවෙමින් පවතින බව පෙනී යයි. අවධානය යොමු කළ යුතු තවත් වැදගත් කරුණක් වන්නේ අනාගත ගෑස් මිලෙහි හැසිරීමයි. ඇමරිකා එක්සත් ජනපදයේ ගෑස්වල මිල සලකා බලන විට යුරෝපයේ සහ ආසියාවේ මිල ගණන්වලට සාපේක්ෂව බොහෝ සේ පහළ අගයක් ගන්නා අතර රාජ්‍යයන් අතර අන්තර් කලාපීය වශයෙන් ගෑස් ගලනයන් (විශේෂයෙන් ඇ.එ.ජ. බලාපොරොත්තු වූ ස්වභාවික වායු නිර්යාතයන් සිදු කළහොත්) එම වෙළඳපොළවල් අතර බොහෝ සබඳතා ඇති කරනු ඇත. කෙසේවෙතත් මෙම සබඳතා මිල යාන්ත්‍රණයන්ගේ ඒකීයත්වයක් ඇති කිරීමකට හෝ මිල ගණන් ඉහළ දැමීමකට හෝ ඉවහල් වන්නක් නොවේ. නමුත් විවිධ වෙළඳපොළ ව්‍යුහයන් ඇති කිරීමටත් ස්වාභාවික වායු ප්‍රවාහනය කිරීමේ ඉහළ පිරිවැය අවම කිරීමටත් සහ ඉහළ ප්‍රාග්ධන පිරිවැයකින් යුත් ද්‍රවීකරණ යටිතල පහසුකම් වර්ධනය කිරීම සම්බන්ධයෙන් වන අවදානම් තත්වයන් අවම කිරීමටත් ඉවහල් වන්නකි. මේ සම්බන්ධයෙන් වන අනෙක් සැලකිය යුතු අවිනිශ්චිතතාව වන්නේ යටිතල පහසුකම් කොපමණ සීඝ්‍රයෙන් වර්ධනය වන්නේ ද යන්නත් වාණිජ යන්ත්‍රෝපකරණ සැපයීමත් සහ ප්‍රවාහන ක්ෂේත්‍රය සඳහා භාවිතා කළ හැකි වැදගත් ඉන්ධනයක් වශයෙන් ස්වාභාවික වායු යොදා ගැනීමත්ය.

මූලාශ්‍රයː "OPEC World Oil Outlook 2013" වාර්තාවෙන් උපුටා ගැනීමකි.

### 1.1.2 ලෝක ඛනිජ තෙල් සැපයුම

තහවුරු කරන ලද බොර තෙල් සංචිත යනුවෙන් අදහස් කරන්නේ භූ විද්‍යාත්මක හා ඉංජිනේරු දත්තයන්ට අනුව ප්‍රත්‍යක්ෂ කර ගන්නා ලද පවත්නා ආර්ථික සහ මෙහෙයුම් තත්වයන් යටතේ අනාගතයේ දී ප්‍රයෝජනයට ගත හැකි ලෙසට පවතින ඇස්තමේන්තුගත බොර තෙල් සංචිත වේ. අවාසනාවකට මෙන් සංචිත පිළිබඳ ඇස්තමේන්තු කිරීම අසීරුය. ලෝකයේ තහවුරු කරන ලද බොර තෙල් සංචිත ඇස්තමේන්තුගත කිරීම ප්‍රධාන කරුණු දෙකක් මත පදනම් වේ.

- ❖ ලෝකයේ සියලුම බොර තෙල් සංචිතවල පවත්නා මුළු ප්‍රමාණය තීරණය කිරීම
- ❖ අදාල තෙල් සංචිතවලින් කොපමණ ප්‍රතිශතයක් නිස්සාරණය කළ හැකිද යන්න තීරණය කිරීම

සංචිතවල පවතින තෙල් ධාරිතාවය සම්බන්ධයෙන් නිවැරදිව දැනගත නොහැකි වීම අභාග්‍යයකි. අවසාන වශයෙන් සොයා ගත හැකි ප්‍රමාණය තීරණය කළ හැක්කේ මෙම තෙල් සොයා ගැනීමට භාවිතා කරන ක්‍රමවේද/ශිල්ප ක්‍රම සහ මෙම ශිල්ප ක්‍රම භාවිත කරමින් ලබා ගත් සාර්ථක තත්වයේ මට්ටම මත පදනම්වය.

ශත වර්ෂ ගණනාවක් සඳහා පාරිභෝගික ඉල්ලුම සපුරාලීමට අවශ්‍ය ප්‍රමාණවත් ඛනිජ තෙල් සම්පත් ලෝකයේ ඇති බව ඛනිජ තෙල් නිධි පිළිබඳව කරන ලද වර්තමාන අධ්‍යයනයන්ගෙන් හෙළි වී ඇත. ලෝක ඛනිජ තෙල් සැපයුමෙහි මූලික ගැටළු ලාභදායී තෙල් ගවේෂණය, නිෂ්පාදනය සහ බෙදා හැරීම යනාදී මූලික කරුණු වටා ගෙතී පවතී.

1980 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා තහවුරු කරන ලද බොර තෙල් සංචිත පිළිබඳව 1.1 ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කරන පරිදි 2002 සිට 2013 දක්වා ඊට පෙර පැවති කාලයට වඩා ලෝකයේ බොර තෙල් සංචිතවල වර්ධනය වීමේ ප්‍රවණතාවයක් ඇත.

1.1 ප්‍රස්ථාරය — තහවුරු කරන ලද බොර තෙල් සංචිත (බැරල් බිලියන) 1980-2013




මූලාශ්‍රය: ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය
සටහන: දත්ත http://www.eia.gov/cfapps/ipdbproject/iedindex3.cfm

1.1 වගුව — තහවුරු කරන ලද බොර තෙල් සංචිත (බැරල් බිලියන) 2009-2013

| කලාපය | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| උතුරු ඇමරිකාව | 207.71 | 206.30 | 208.90 | 210.53 | 213.90 |
| මධ්‍යම හා දකුණු ඇමරිකාව | 122.69 | 124.64 | 237.11 | 238.82 | 325.93 |
| යුරෝපය | 13.66 | 13.31 | 12.08 | 11.88 | 12.02 |
| යුරේසියාව | 98.89 | 98.89 | 98.89 | 98.89 | 118.89 |
| මැද පෙරදිග | 746.00 | 753.36 | 799.61 | 799.61 | 802.16 |
| අප්‍රිකාව | 117.06 | 119.11 | 124.21 | 124.21 | 127.74 |
| ආසියා සහ ඕෂනියා | 34.01 | 40.14 | 42.03 | 42.03 | 45.36 |
| **ලෝකය** | **1,340.02** | **1,355.75** | **1,473.76** | **1,525.96** | **1,645.98** |

මූලාශ්‍රය: http://www.eia.gov/cfapps/ipdbproject/IEDIndex3.cfm

**1.2 වගුව — තෙල් සංචිත පවත්නා රටවල් (බැරල් බිලියන) - 2013**

| අනු අංකය | රට | ප්‍රමාණය |
|---|---|---|
| 01 | වෙනිසියුලාව | 297.60 |
| 02 | සවුදි අරාබිය | 267.91 |
| 03 | කැනඩාව | 173.11 |
| 04 | ඉරානය | 154.58 |
| 05 | ඉරාකය | 141.35 |
| 06 | කුවේට් | 104.00 |
| 07 | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 97.80 |
| 08 | රුසියාව | 80.00 |
| 09 | ලිබියාව | 48.01 |
| 10 | නයිජීරියාව | 37.20 |

මූලාශ්‍රය:http://gulfbusiness.com/2013/04/top-10-countries-with-the-worlds-biggest-oil-reserves/#.Uy5Lbc7ozXQ

2013 වර්ෂය වන විට ලොව විශාලතම ඛනිජ තෙල් සංචිත සතු රටවල් අතුරින් පෙරමුණෙහි සිටින රටවල් 10 පිළිබඳ විස්තර 1.2 වගුව මගින් පෙන්වයි. එම රටවල් අතුරින් ඉහළ තෙල් සංචිත සතු රාජ්‍යයන් පහ පිළිවෙළින් වෙනිසියුලාව, සවුදි අරාබිය, කැනඩාව, ඉරානය සහ ඉරාකයයි. තෙල් සංචිත ප්‍රමාණයෙන් ප්‍රථම ස්ථානයේ පසු වූ සවුදි අරාබිය අභිබවා වෙනිසියුලාව 2012 වර්ෂයේ ප්‍රථම ස්ථානයට පත් වී ඇත. වෙනිසියුලාව ලෝකයේ ඉහළම තෙල් නිධි පවතින රට බවට පත් වී සිටියත් 2012 වර්ෂයේදී එරටේ සමස්ත තෙල් සැපයුම දිනකට බැරල් මිලියන 2.5කි.

කෙසේවුවත්, ලෝකයේ තහවුරු කරන ලද තෙල් සංචිතයන්ගෙන් 1/5ක් සවුදි අරාබිය සතු වන අතර එය ලෝකයේ ඉහළම තෙල් නිෂ්පාදකයා සහ අපනයනකරු වශයෙන් ශ්‍රේණිගත කර ඇත. 2012 වර්ෂයේ දී සවුදි අරාබිය දිනකට තෙල් බැරල් මිලියන 11.5ක ප්‍රමාණයක් සැපයුම් කර ඇත. ලෝක ද්‍රවීකෘත ඉන්ධන සැපයුමෙහි මෑත කාලීන වර්ධනයට සුවිශේෂී දායකත්වයක් සැපයුවෙක් ලෙස කැනඩාවේ තෙල් වැලි පත් වී ඇති අතර එම තෙල් වැලි කැනඩාවෙහි තහවුරු කර ගත් තෙල් සංචිතවලින් බහුතරයක් වේ. ඒ අනුව කැනඩාව ලෝකයේ තුන්වන තෙල් නිපදවන රට බවට පත්ව ඇත. ජාත්‍යන්තර සම්බාධක ඉරානයේ බලශක්ති අංශයට විශාල බලපෑමක් එල්ල කරන ලද අතර ඒ හේතුවෙන් එරටෙහි ඛනිජ තෙල් නිෂ්පාදනය 2012 දී ඉතා විශාල වශයෙන් අඩු වී ඇත. එය 2011 දී දිනකට බැරල් මිලියන 35 සිට 2012 බැරල් මිලියන 3.5 ක් දක්වා අඩු වී ඇත.

2008 සිට 2013 දක්වා සය අවුරුදු කාල සීමාව තුළ කලාප වශයෙන් ලෝකයේ දෛනික තෙල් නිෂ්පාදනය 1.2 රූප සටහනින් පෙන්වා ඇත. 2013 වර්ෂයේදී ලෝකයේ දෛනික තෙල් නිෂ්පාදනය බැරල් මිලියන 90 කි. අනෙකුත් කලාප 06ට සාපේක්ෂව යුරෝපීය කලාපයේ තෙල් නිෂ්පාදනය ඉතා පහළ මට්ටමක පවතී. එය මුළු දෛනික ලෝක තෙල් නිෂ්පාදනයෙන් 4%ක ප්‍රමාණයකි (බැරල් මිලියන 4කි.) 2008-2013 කාලය තුළ දී මැද පෙරදිග කලාපය ලෝක තෙල් නිෂ්පාදනයේ ප්‍රථම ස්ථානය ගෙන ඇත. එය දෛනික ලෝක තෙල් නිෂ්පාදනයෙන් 30% කි (බැරල් මිලියන 27කි.) ලෝකයේ දෙවන විශාලම තැනට තෙල් නිෂ්පාදනය කරන රට උතුරු ඇමරිකාව වන අතර එය මුළු ලෝක නිෂ්පාදනයෙන් 21% කි (බැරල් මිලියන 19 කි.)

**1.2 ප්‍රස්ථාරය — ලෝක තෙල් නිෂ්පාදනය (දිනකට බැරල් දහස්වලින්) 2008-2013**




මූලාශ්‍රය: ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය
**සටහන: දත්ත** - http://www.eia.gov/cfapps/ipdbproject/iedindex3.cfm

2012 වර්ෂයේ ලොව ඉහළම ඛනිජ තෙල් නිෂ්පාදකයන් පස්දෙනා ලෙස වාර්තා වන්නේ සවුදි අරාබිය, ඇමරිකා එක්සත් ජනපදය, රුසියාව, චීනය, හා කැනඩාවයි (1.3 වගුව) එම රටවල් අතුරින් ඉහළ නිෂ්පාදනයක් පෙන්නුම් කරන රටවල් දෙක වන ඇමරිකා එක්සත් ජනපදය සහ සවුදි අරාබිය විසින් දෛනිකව බැරල් මිලියන 11 බැගින් නිෂ්පාදනය කරනු ලබන අතර එය මුළු ලෝක නිෂ්පාදනයෙන් 25%කට ආසන්න ප්‍රමාණයකි. 2012 වර්ෂයේ ලොව ඉහළම ඛනිජ තෙල් අපනයනකරුවන් පස්දෙනා ලෙස වාර්තා වන්නේ පිළිවෙළින් සවුදි අරාබිය, රුසියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, කුවේට් සහ නයිජීරියාව යන රටවල්ය (1.4 වගුව.)

**1.3 වගුව** — තෙල් නිෂ්පාදනයේ ප්‍රමුඛ රටවල් (දිනකට බැරල් දහස්වලින්) - 2012

| අනු අංකය | රට | ප්‍රමාණය |
|---|---|---|
| 01 | සවුදි අරාබිය | 11,726 |
| 02 | ඇමරිකා එක්සත් ජනපදය | 11,115 |
| 03 | රුසියාව | 10,397 |
| 04 | චීනය | 4,416 |
| 05 | කැනඩාව | 3,856 |
| 06 | ඉරානය | 3,589 |
| 07 | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 3,213 |
| 08 | ඉරාකය | 2,987 |
| 09 | මෙක්සිකෝව | 2,936 |
| 10 | කුවේට් | 2,797 |
| 11 | බ්‍රසීලය | 2,652 |
| 12 | නයිජීරියාව | 2,524 |
| 13 | වෙනිසියුලාව | 2,489 |
| 14 | නෝර්වේ | 1,902 |
| 15 | ඇල්ජීරියාව | 1,875 |

මූලාශ්‍රය: www.eia.gov/countries/index.cfm

**1.4 වගුව** — තෙල් අපනයනයේ ප්‍රමුඛ රටවල් (දිනකට බැරල් දහස්වලින්) - 2012

| අනු අංකය | රට | ප්‍රමාණය |
|---|---|---|
| 01 | සවුදි අරාබිය | 8,865 |
| 02 | රුසියාව | 7,201 |
| 03 | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 2,595 |
| 04 | කුවේට් | 2,414 |
| 05 | නයිජීරියාව | 2,254 |
| 06 | ඉරාකය | 2,235 |
| 07 | ඉරානය | 1,880 |
| 08 | ඇන්ගෝලාව | 1,778 |
| 09 | වෙනිසියුලාව | 1,712 |
| 10 | නෝර්වේ | 1,684 |
| 11 | කැනඩාව | 1,570 |
| 12 | ඇල්ජීරියාව | 1,547 |
| 13 | කටාර් රාජ්‍යය | 1,389 |
| 14 | කසකස්තානය | 1,355 |
| 15 | ලිබියාව | 1,313 |

මූලාශ්‍රය: www.eia.gov/countries/index.cfm

### 1.1.3 ලෝක ඛනිජ තෙල් ඉල්ලුම

ප්‍රවාහන, කාර්මික, වාණිජ, ගෘහස්ථ හා අනෙකුත් ක්‍රියාකාරකම් පුළුල් වීම හේතුවෙන් බලශක්ති අවශ්‍යතාව සපුරා ගනු වස් ගෝලීය ඛනිජ තෙල් ඉල්ලුම ඉහළ ගොස් ඇත.

1.3 ප්‍රස්ථාරය මගින් 2008-2012 වසර 5ක කාලය තුළ දෛනික කලාපීය ඛනිජ තෙල් පරිභෝජනය පෙන්වයි. 2012 වර්ෂයේ දෛනික ඛනිජ තෙල් පරිභෝජනය බැරල් මිලියන 89කි. ඒ අතරින් අප්‍රිකානු කලාපයේ තෙල් පරිභෝජනය අනෙකුත් කලාපවලට සාපේක්ෂව අඩු මට්ටමක පවතී. එනම් ලෝක දෛනික තෙල් පරිභෝජනයෙන් 3% ක් (බැරල් මිලියන 3.4කි) වැනි ප්‍රමාණයකි. 33%ක ප්‍රතිශතයක් පෙන්නුම් කරමින් 2008-2012 අතර කාලය තුළ ලෝකයේ ඛනිජ තෙල් පරිභෝජනය කරන කලාප අතරින් ආසියා සහ ඕෂනියා කලාපීය රටවල් පෙරමුණ ගෙන ඇත. එය දිනකට බැරල් මිලියන 30කි. 25%ක ප්‍රතිශතයක් පෙන්නුම් කරමින් උතුරු ඇමරිකානු කලාපය ලෝක තෙල් පරිභෝජනයේ දෙවන ස්ථානය ගෙන ඇති අතර එය දිනකට බැරල් මිලියන 23ක පරිභෝජනයකි.

2008-2012 කාලය තුළ ලොව ඉහළම තෙල් නිෂ්පාදිත කලාප අතරින් ප්‍රථම ස්ථානය මැද පෙරදිග කලාපය හිමි කර ගනු ලැබුව ද එය තෙල් පරිභෝජන කලාප අතර සිවු වන ස්ථානයේ රැඳී සිටී. එසේම එම කාල පරිච්ඡේදය තුළ අවම තෙල් නිෂ්පාදන කලාපය යුරෝපා කලාපය වුව ද තෙල් පරිභෝජනයෙන් එය තෙවන ස්ථානය හිමිකර ගෙන ඇත.

**1.3 ප්‍රස්ථාරය** — ලෝක තෙල් පරිභෝජනය (දිනකට බැරල් දහස්වලින්) 2008-2012




මූලාශ්‍රය: ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය
සටහන: දත්ත - http://www.eia.gov/cfapps/ipdbproject/iedindex3.cfm

ලෝකයේ බොර තෙල් ආනයනය කරන ඉහළම රටවල් දහය වන්නේ ඇමරිකා එක්සත් ජනපදය, ජපානය, ජර්මනිය, දකුණු කොරියාව, ප්‍රංශය,ඉතාලිය, චීනය, ස්පාඤ්ඤය, ඉන්දියාව හා නෙදර්ලන්තයයි. කාර්මික රටවල් ඔවුන් නිෂ්පාදනය කරන ප්‍රමාණයට වඩා පරිභෝජනය කරනු ලබන අතර ඉන් බහුතර ප්‍රමාණයක් ආනයනය කරනු ලබන්නේ මැද පෙරදිග රටවලිනි. යුරෝපය හා ජපානය එක්ව පරිභෝජනය කරනු ලබන මුළු ඉන්ධන ප්‍රමාණය අමරිකා එක්සත් ජනපදයේ පරිභෝජනයට වඩා ඉහළ අතර ඔවුන් ඛනිජ තෙල් ආනයනයද කරයි. 2012 වර්ෂයේ ලෝකයේ ඉහළම තෙල් ආනයනකරුවන් වන්නේ පිළිවෙළින් ඇමරිකා එක්සත් ජනපදය, චීනය, ජපානය, ඉන්දියාව, දකුණු කොරියාව යන රටවල්ය.

**1.5 වගුව — තෙල් ආනයනයේ ප්‍රමුඛ රටවල් (දිනකට බැරල් දහස්වලින්) - 2012**

| අනු අංකය | රට | ප්‍රමාණය |
|---|---|---|
| 01 | ඇමරිකා එක්සත් ජනපදය | 7,440 |
| 02 | චීනය | 5,861 |
| 03 | ජපානය | 4,579 |
| 04 | ඉන්දියාව | 2,632 |
| 05 | දකුණු කොරියාව | 2,240 |
| 06 | ජර්මනිය | 2,219 |
| 07 | ප්‍රංශය | 1,668 |
| 08 | සිංගප්පූරුව | 1,360 |
| 09 | ස්පාඤ්ඤය | 1,260 |
| 10 | ඉතාලිය | 1,198 |
| 11 | තායිවානය | 1,058 |
| 12 | නෙදර්ලන්තය | 949 |
| 13 | තුර්කිය | 614 |
| 14 | බෙල්ජියම | 607 |
| 15 | ඕස්ට්‍රේලියාව | 607 |

මූලාශ්‍රය: www.eia.gov/countries/index.cfm

2012 වර්ෂයේදී ඇමරිකා එක්සත් ජනපදය ලෝකයේ විශාලතම ඛනිජ තෙල් පාරිභෝගිකයා වශයෙන් දිනකට බැරල් මිලියන 18කට ආසන්න ප්‍රමාණයක් භාවිතා කොට ඇත. එය මුළු ලෝක තෙල් පරිභෝජනයෙන් 20%ක ප්‍රමාණයකි. කෙසේ වෙතත් ඇමරිකා එක්සත් ජනපදයේ නිපදවා ඇත්තේ දිනකට බැරල් මිලියන 11ක් පමණි. එය මුළු ලෝක නිෂ්පාදනයෙන් 13%ක් පමණ ප්‍රමාණයකි. ඒ අනුව දෛනික බැරල් මිලියන 07ක ශුද්ධ ආනයන අවශ්‍යතාවක් මතුව ඇත. මෙම ඛනිජ තෙල් බොහොමයක් භාවිතා කර ඇත්තේ මෝටර් රථ ඉන්ධන වශයෙනි. මෙය ලෝකයේ ආනයන අවශ්‍යතාවයෙන් වැඩිම ප්‍රමාණයක් වන අතර එය ලෝක මුළු ඛනිජ තෙල් නිෂ්පාදනයෙන් 9%ක ප්‍රමාණයකි.

දෙවැනි විශාලම ඛනිජ තෙල් පාරිභෝගිකයා චීනය වන අතර එහි පරිභෝජනය මුළු ලෝක ඛනිජ තෙල් නිෂ්පාදනයෙන් 15%කට සමාන වේ. ඇමරිකා එක්සත් ජනපදය මෙන් නොව චීනය විසින් ඉතා අවම ඛනිජ තෙල් ප්‍රමාණයක් නිෂ්පාදනය කරන අතර මුළු අවශ්‍යතාවයෙන් 60% ක ප්‍රමාණයක් ඔවුන්ට ආනයනය කිරීමට සිදු වී ඇත.

ප්‍රංශය හා ජර්මනිය ලෝකයේ ඛනිජ තෙල් ප්‍රමාණයෙන් 6%ක් පරිභෝජනය කරන අතර ඔවුන් ඛනිජ තෙල් නිෂ්පාදනය නොකරන තරම්ය. මැදපෙරදිග රටවල් ලෝක තෙල් නිෂ්පාදනයෙන් 30%ක් පමණ නිෂ්පාදනය කරන අතර ලෝක තෙල් පරිභෝජනයෙන් 7%ක ප්‍රමාණයක් භාවිතා කරයි. ආසියාතික රටවල තත්වය මීට වඩා වෙනස්ය. එය මුළු ලෝක පරිභෝජනයෙන් 27%ක ප්‍රමාණයක් භාවිතා කරන අතර එම රටවල නිෂ්පාදනය ලෝක නිෂ්පාදනයෙන් 11%ක ප්‍රමාණයකි.

**1.6 වගුව — තෙල් පරිභෝජනයේ ප්‍රමුඛ රටවල් (දිනකට බැරල් දහස්වලින්) - 2012**

| අනු අංකය | රට | ප්‍රමාණය |
|---|---|---|
| 01 | ඇමරිකා එක්සත් ජනපදය | 18,555 |
| 02 | චීනය | 10,277 |
| 03 | ජපානය | 4,715 |
| 04 | ඉන්දියාව | 3,622 |
| 05 | රුසියාව | 3,195 |
| 06 | සවුදි අරාබිය | 2,861 |
| 07 | බ්‍රසීලය | 2,807 |
| 08 | ජර්මනිය | 2,388 |
| 09 | දකුණු කොරියාව | 2,301 |
| 10 | කැනඩාව | 2,287 |
| 11 | මෙක්සිකෝව | 2,145 |
| 12 | ප්‍රංශය | 1,740 |
| 13 | ඉරානය | 1,709 |
| 14 | එක්සත් රාජධානිය | 1,503 |
| 15 | ඉන්දුනීසියාව | 1,384 |

මූලාශ්‍රය: www.eia.gov/countries/index.cfm

ඛනිජ තෙල් සඳහා ඉල්ලුම ආර්ථික අංශ අනුව සලකා බැලීමේදී 1980 වර්ෂයේ සිට ඛනිජ තෙල්

සඳහා පවතින ඉල්ලුමෙහි වර්ධනය වැඩි වශයෙන් ඉස්මතු වී ඇත්තේ ප්‍රවාහන ක්ෂේත්‍රය තුළය. එනම් ගොඩබිම්, ගුවන්, අභ්‍යන්තර ජල මාර්ග, මුහුදු වැනි ප්‍රවාහන මාධ්‍යයන්වල භාවිතය හේතුවෙනි. 2012 ලෝක ඛනිජ තෙල් දැක්ම (woo) නමැති වාර්තාව පෙන්වාදෙන පරිදි පසුගිය දශක දෙකක කාලය තුළ ආර්ථික සහයෝගීතාවය සහ සංවර්ධනය පිළිබඳ සංවිධානයට (OECD) සහ එම සංවිධානයට අයත් නොවන රටවල් සාමාන්‍ය වාර්ෂික ඛනිජ තෙල් ඉල්ලුමෙහි වර්ධනය බොහෝ දුරට සමාන වේ. එය දිනකට බැරල් මිලියන 0.3 ක පමණ ප්‍රමාණයකි. OECD රටවල් සහ යුරේසියානු රටවල් සමග සන්සන්දනය කිරීමේදී සංවර්ධනය වන රටවල වෙනත් අංශ සඳහා ඔවුන්ගේ ඛනිජ තෙල් භාවිතය වැඩි වී ඇත. එනම් ඛනිජ රසායනික ද්‍රව්‍ය, ගෘහස්ථ, වාණිජ, කෘෂිකර්ම සහ අනෙකුත් කාර්මික අංශයන්හි ප්‍රයෝජනයට ගනී.

**1.4 ප්‍රස්ථාරය** ආර්ථික අංශ අනුව තෙල් ඉල්ලුම - 2010




මූලාශ්‍රය: OPEC World Oil Outlook 2013

### 1.1.4 ජාත්‍යන්තර වෙළඳපොළ මිල හැසිරීම

ලෝකයේ පවතින රටවලට ශක්තිමත් ආර්ථික වර්ධනයක් ලබා ගැනීම සහ පවත්වාගෙන යාම සඳහා ලාභදායී ලෙස සහ ප්‍රමාණවත් පරිදි ඛනිජ තෙල් සැපයීම තීරණාත්මක සාධකයකි. ඛනිජ තෙල්වල මිල සහ පවත්නා ප්‍රමාණය, වාහන සංඛ්‍යාව, ඉන්ධනවල ගුණාත්මකභාවය, තෙල් අපනයනය කරන රටවල දේශපාලනික ස්ථාවරත්වය සහ තෙල් සැපයුම් නළ මාර්ග ආරක්ෂා කිරීමේ හැකියාව යන ප්‍රධාන සාධක මත පාලනය වේ. ඛනිජ තෙල් නිෂ්පාදනවල මිල ගණන් ඉහත උච්ඡාවචනය වන විචල්‍යයන්ට අනුව නිරන්තර වෙනස්වීම්වලට භාජනය වෙමින් පවතී.

විකල්ප බලශක්ති මූලාශ්‍රයන් සොයා ගැනීම, මැදපෙරදිග නොවන රටවලින් තෙල් මිලදී ගැනීම හෝ ලෝකයේ වෙනත් රටවලින් තෙල් කැණීම මගින් වර්තමානයේ මැදපෙරදිග රටවල් ලෝක ආර්ථිකය මත පතුරුවා ඇති බලය වෙනස් කිරීමේ හැකියාව ඉතා අල්පය. ඒ අනුව ඉදිරි දශක කිහිපයක් ගත වන තුරු ස්ථාවර ඛනිජ තෙල් මිල ගණන් සහ ඒවායෙහි සුලභතාවය සෘජුවම මැදපෙරදිග රටවල් මත රඳා පවතිනු ඇත.

2013 ජනවාරි සිට දෙසැම්බර් දක්වා බොර තෙල් බැරලයක මාසික Brent මිල 1.5 ප්‍රස්ථාරය මගින් දැක්වේ. 2013 වර්ෂය තුළ දී Brent වෙළඳපොළේ බොර තෙල් බැරලයක මාසික මිල විචලනය සලකා බලන විට වර්ෂය ආරම්භයේදී එනම් ජනවාරි මාසයේ මිල රු. 14,518 ක් වාර්තා කළ අතර එය අප්‍රේල් මාසයේ දී රු. 13,012 ක් දක්වා පහළ ගොස් ඇත (පෙබරවාරි හැර). එය නැවත වරක් සැප්තැම්බර් මාසය දක්වා වැඩිවීමක් පෙන්නුම් කරන අතර 2013 අගභාගය වන විට පහත බැස ඇත. කෙසේ නමුත් ජනවාරි සහ දෙසැම්බර් මාසවල විශාල මිල විචලනයක් පෙන්නුම් නොකරන අතර වසර පුරා යම් සැලකිය යුතු මට්ටමක මිල විචලනයක් පෙන්නුම් කර ඇත.

**1.5 ප්‍රස්ථාරය** බොර තෙල්වල මාසික Brent මිල (බැරලයක මිල රු.) - 2013




මූලාශ්‍රය: ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය

**1.6 ප්‍රස්ථාරය** බොර තෙල්වල වාර්ෂික Brent මිල (බැරලයක මිල රු.) 2000-2013




මූලාශ්‍රය: ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය

2000 - 2013 දක්වා වසර 14 ක කාලය තුළ Brent වෙළඳපොළේ බොර තෙල් බැරලයක වාර්ෂික මිල වෙනස් වීම 1.6 ප්‍රස්ථාරය මගින් පෙන්වයි. බොර තෙල් බැරලයක වාර්ෂික මිල 2000 වර්ෂයේදී රු. 2,161 ක් වූ අතර 2008 වන විට 10,492ක් දක්වා ක්‍රමයෙන් වර්ධනය වී ඇත. 2009 වර්ෂයේදී බොර තෙල් බැරලයක මිල 2008 වර්ෂයේ මිලේ සිට රු.7,068 ක් දක්වා පහළ ගොස් ඇත. කෙසේ නමුත් 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය වන විට එය නැවතත් රු. 10,036 ක ප්‍රමාණයකින් රු 17,104 දක්වා ඉහළ ගොස් ඇත. 2000 වර්ෂය පදනම් වර්ෂය ලෙස සැලකීමේ දී 2013 වර්ෂය වන විට බොර තෙල් බැරලයක මිල 691% කින් ඉහළ යාමක් පෙන්නුම් කරයි. ලෝකයේ ප්‍රධාන ඛනිජ තෙල් වෙළඳපොළවල් 03ක් වන Brent, WTI සහ Platts වෙළඳපොළවල 2013 වර්ෂයේ බොර තෙල් බැරලයක මාසික මිලෙහි හැසිරීම 1.7 ප්‍රස්ථාරය මගින් දැක්වේ. ඒ අනුව Brent වෙළඳපොළෙහි බොරතෙල් බැරලයක මිල හැසිරීම සෑමවිටම WTI සහ Platts යන වෙළඳපොළ මිල ගණන්වලට වඩා වර්ෂය පුරාම ඉහළ බවක් පෙන්නුම් කරයි.

**1.7 ප්‍රස්ථාරය — විවිධ වෙළඳපොළවල බොර තෙල්වල මාසික මිල හැසිරීම (බැරලයක මිල රු.) - 2013**




මූලාශ්‍රය: ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය

පහත 1.8 ප්‍රස්ථාරය මගින් 2013 වර්ෂය තුළ Platts වෙළඳපොළේ ඔක්ටේන් 90 පෙට්‍රල්, ඔටෝ ඩීසල් සහ භූමිතෙල් යන ඛනිජ තෙල් නිෂ්පාදනවල මාසික මිල ගණන්වල හැසිරීම පෙන්වයි.

**1.8 ප්‍රස්ථාරය — පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදනවල Platts මිල (බැරලයක මිල රු.) - 2013**




මූලාශ්‍රය: ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය

**1.9 ප්‍රස්ථාරය — පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදනවල Platts මිල (බැරලයක මිල රු.) 2002-2013**




මූලාශ්‍රය: ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය

ඉහත 1.9 ප්‍රස්ථාරය මගින් පසු ගිය වර්ෂ 12ක කාලය (2002-2013) තුළ පාරිභෝගිකයන්ගෙන් බහුතරයක් විසින් පරිභෝජනය කරන ලද ඔක්ටේන් 90 පෙට්‍රල්, ඔටෝ ඩීසල් සහ භූමිතෙල් යන නිමි ඛනිජ තෙල් නිෂ්පාදනවල Platts වෙළඳපොළේ වාර්ෂික මිල විචල්‍යතාව පෙන්වයි. 2002-2008 කාලය තුළ මෙම නිෂ්පාදන තුනෙහි මිල ගණන් අඛණ්ඩව වැඩි වී ඇති අතර 2009 වර්ෂයේ දී ඒවායෙහි මිල පහත වැටී ඇත. කෙසේවෙතත් 2012 වන විට නැවතත් මිල ගණන් වැඩි වීමක් පෙන්නුම් කරයි. 2002 සිට 2005 තෙක් මෙම නිෂ්පාදනවල මිල ගණන් ඉතා කිට්ටුවෙන් ගමන් කර ඇතත් 2006 සිට ඔක්ටේන් 90 පෙට්‍රල්වල මිල අනෙක් නිෂ්පාදනවල (ඔටෝ ඩීසල් සහ භූමිතෙල්) මිලට වඩා පහත අගයක් ගෙන ඇත.

## 1.2 ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් කර්මාන්තය

### 1.2.1 හැඳින්වීම

රටේ සියලුම පුරවැසියන්ගේ ජීවිතවලට ඛනිජ තෙල්වලින් ඇති වන දායකත්වය සහ අත්‍යවශ්‍යතාවය සලකා බලමින් ඛනිජ තෙල් කර්මාන්තයේ පසුභාග ක්‍රියාවලීන් වන ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, අපනයනය, පිරිපහදුව, නිෂ්පාදනය, මිශ්‍ර කිරීම, ගබඩා කිරීම, බෙදා හැරීම, ප්‍රවාහනය සහ තොග සහ සිල්ලර වෙළඳම යනා දී කාර්යයන් ඉටු කිරීම සඳහා රජය විසින් 1961 ජූනි මස අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත අනුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංසංථාව ස්ථාපිත කරන ලදී.

කලින් කලට බලයට පත් වූ රජයන් විසින් ගනු ලැබූ විවිධ ප්‍රතිපත්තිමය තීරණයන් හේතුවෙන් ශ්‍රී ලාංකේය ඛනිජ තෙල් කර්මාන්තයේ හැසිරීම ව්‍යුහාත්මක වෙනස්කම්වලට භාජනය වී ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පෞද්ගලික අංශයේ සමාගම් බොහොමයක් ලිහිසි තෙල්, තාර සහ නැව් තෙල් ආනයනය, බෙදා හැරීම සහ අලෙවිය යන විවිධ පැතිමාන ඔස්සේ වෙළඳපොළ තුළට ඇතුළු වී ඇත. මෙම වතාරණය තුළ 2003 දී ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් වෙළඳපොළ ලිහිල්කරණය කිරීම තුළ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාග ම පිහිටුවන ලදී. එවකට ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ කොටස්වලින් 1/3ක් ලබා ගනිමින් ලංකා ඉන්දියානු තෙල් සමාගම ඛනිජ තෙල් අලෙවි අංශයට දෙවැනි පාර්ශවයක් ලෙස ඇතුළු වූ අතර එම සමාගමේ කොටස්වලින් 2/3 ක් අයත් වන්නේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවටය.

කෙසේ නමුත්, ඛනිජ තෙල් කර්මාන්තයේ පසුභාග ක්‍රියාවලිය මනා ලෙස කළමනාකරණය කරමින් එහි උන්නතිය උදෙසා ප්‍රතිපත්තිමය තීරණ සහ නිර්දේශ සම්පාදනය කරනු වස් කැබිනට් අමාත්‍යාංශයක අවශ්‍යතාව මත 2010 අප්‍රේල් 30 දිනැති අංක 1651/20 දරණ අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය ස්ථාපිත කරන ලදී.

### 1.2.2 ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය

2007 සිට 2013 වර්ෂය දක්වා වසර 07ක කාලය තුළ මෙරටට ආනයනය කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන පිළිබඳ තොරතුරු 1.10 ප්‍රස්ථාරය මගින් පෙන්වයි. එම කාල පරිච්ඡේදය තුළ ඉහළ ආනයනයක් වාර්තා කෙරෙනුයේ 2012 වර්ෂයේදීය. එය කි.ග්‍රෑ. මිලියන 5,880කි. අවම ආනයනයක් 2009 වර්ෂයේ දී වන අතර එය කි.ග්‍රෑ. මිලියන 1,500කි.

1.11 සහ 1.12 ප්‍රස්ථාරයන් මගින් 2007-2013 කාලය තුළ පිළිවෙළින් ද්‍රවීකෘත වායු සහ ලිහිසි තෙල් ආනයනයන් සම්බන්ධ තොරතුරු පෙන්වයි.

**1.10 ප්‍රස්ථාරය** පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන 2007-2013




මූලාශ්‍රය: ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය
සටහන: දත්ත-ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව (තාවකාලික)

**1.11 ප්‍රස්ථාරය** ද්‍රවීකෘත වායු ආනයන 2007-2013




මූලාශ්‍රය: ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය
සටහන: දත්ත-ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව (තාවකාලික)

**1.12 ප්‍රස්ථාරය** ලිහිසි තෙල් ආනයන 2007-2013




මූලාශ්‍රය: ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය
සටහන: දත්ත-ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව (තාවකාලික)
සංයෝජිත වර්ගීකරණ සංකේත - 27101907, 27101908, 27101970, 27101970

### 1.2.3 දේශීය වෙළඳපොළ මිල හැසිරීම

ශ්‍රී ලංකාවේ මෑත කාලීන ඉතිහාසය තුළ ඉන්ධනවල මිල නියම කිරීම සළකා බැලීමේ දී අවස්ථා ගණනාවක් තුළ දී මිල සංශෝධනයන් සිදු කර ඇති අතර සමහර විට එකම වර්ෂයේ කිහිප වරක් ද මිල සංශෝධනයන් සිදු කර ඇත. 2005-2013 කාල පරාසය කෙරෙහි අවධානය යොමු කිරීමේ දී බහුතරයක් විසින් පරිභෝජනය කරනු ලබන ඛනිජ තෙල් නිෂ්පාදන පිළිබඳව සලකා බලන විට ඔක්ටේන් 90 පෙට්‍රල්වල මිල 27 වතාවක් ද, ඔක්ටේන් 95 පෙට්‍රල්වල මිල 26 වතාවක් ද සහ ඔටෝ සහ සුපර් ඩීසල්වල මිල 24 වතාවක් ද සංශෝධනය කර ඇත. භූමිතෙල් හා කර්මාන්ත සඳහා භාවිතා කරන භූමිතෙල් මිල පිළිවෙළින් 18 වතාවක් සහ 19 වතාවක් සංශෝධනය කර ඇත. 2005-2013 කාලය තුල සිදු කර ඇති මිල සංශෝධනයන් උපග්‍රන්ථයෙහි දක්වා ඇත.

1.7 වගුව මගින් 2005-2013 කාලය තුළ දෙසැම්බර් 31 දිනට ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර මිල ගණන් පෙන්වන අතර 1.13 ප්‍රස්ථාරය මගින් ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදන තුනක එනම් ඔක්ටේන් 90 පෙට්‍රල්, ඔටෝ ඩීසල් සහ භූමිතෙල් මිල විචලනයන් දැක්වේ.

1.7 වගුව ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර මිල (දෙසැම්බර් 31 දිනට ලීටරයක මිල රු.) 2005 - 2013

| වර්ෂය | නිෂ්පාදන වර්ගය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | පෙට්‍රල් | | ඩීසල් | | භූමිතෙල් | දැවි තෙල් | | |
| | ඔක්ටේන් 90 | ඔක්ටේන් 95 | ඔටෝ ඩීසල් | සුපර් ඩීසල් | | තත්පර 1000 | තත්පර 1500 | තත්පර 3500 |
| 2005 | 80.00 | 83.00 | 50.00 | 55.30 | 30.50 | 31.40 | 30.30 | 26.00 |
| 2006 | 92.00 | 95.00 | 60.00 | 65.30 | 48.00 | 44.40 | 43.30 | 41.00 |
| 2007 | 117.00 | 120.00 | 75.00 | 80.00 | 68.00 | 52.70 | 51.70 | 46.65 |
| 2008 | 120.00 | 133.00 | 70.00 | 85.30 | 50.00 | 33.90 | 31.70 | 25.00 |
| 2009 | 115.00 | 133.00 | 73.00 | 88.30 | 51.00 | 34.90 | 32.70 | 26.00 |
| 2010 | 115.00 | 133.00 | 73.00 | 88.30 | 51.00 | 42.20 | 40.00 | 40.00 |
| 2011 | 137.00 | 155.00 | 84.00 | 106.30 | 71.00 | 52.20 | 50.00 | 50.00 |
| 2012 | 159.00 | 167.00 | 115.00 | 142.00 | 106.00 | 92.20 | 90.00 | 90.00 |
| 2013* | 162.00 | 170.00 | 121.00 | 145.00 | 106.00 | 92.20 | 90.00 | 90.00 |

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
සටහන: *2014 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔක්ටේන් 90 පෙට්‍රල් වෙනුවට ඔක්ටේන් 92 පෙට්‍රල් හඳුන්වාදීමට තීරණය කරන ලදී.

1.13 ප්‍රස්ථාරය ඛනිජ තෙල් නිෂ්පාදනවල සිල්ලර මිල (දෙසැම්බර් 31 දිනට ලීටරයක මිල රු.) 2005-2013




මූලාශ්‍රය: ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය

### 1.2.4 ඛනිජ තෙල් නිෂ්පාදන පිරිපහදු කිරීම

සපුගස්කන්ද තෙල් පිරිපහදුව 1969 දී දිනකට තෙල් බැරල් 38,000ක් පිරිපහදු කිරීමේ ධාරිතාවක් සහිතව ස්ථාපිත කරන ලදී. ඉන් පසු දෛනික තෙල් බැරල් 50,000ක ධාරිතාවක් දක්වා වර්ධනය වන පරිදි මෙම පිරිපහදුව වරින්වර නවීකරණයන්ට භාජනය වී ඇත. වර්තමානයේ දී රට තුළ බොර තෙල් පිරිපහදු කිරීම තුළින් රටෙහි සමස්ත වාර්ෂික ඛනිජ තෙල් ඉල්ලුමෙන් 35-40% ප්‍රමාණයකට තෙල් පිරිපහදුවේ මුළු නිෂ්පාදනය දායක වේ. පෙට්‍රල්, ඔටෝ ඩීසල් සුපර් ඩීසල්, දැවි තෙල්, භූමිතෙල්, ද්‍රවීකෘත වායු, ගුවන් යානා ඉන්ධන, තාර, කෙමිකල් නැප්තා සහ

සොල්වන්ට්ස් යනාදී නිමි භාණ්ඩ පිරිපහදුවෙන් නිෂ්පාදනය කරයි.

### 1.2.5 ඛනිජ තෙල් නිෂ්පාදන වෙළඳම

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් දිවයින පුරා පිහිටා ඇති 1,074ක් වූ පිරවුම් මධ්‍යස්ථාන මගින් ඩීසල්, පෙට්‍රල්, භූමිතෙල් හා ලිහිසි තෙල් වැනි ඛනිජ තෙල් නිෂ්පාදන බෙදා හරිනු ලබයි. 2003 වර්ෂය දක්වා බොර තෙල් ආනයනය, පිරිපහදුව සහ පාරිභෝගිකයන්ට සැපයීම සඳහා වූ එකම නියෝජිතයා වූයේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවයි. 2003 වර්ෂයේ ලංකාවේ පසුභාග ඛනිජ තෙල් වෙළඳමෙහි මෙහෙයුම් කටයුතු සඳහා ලංකා ඉන්දියානු තෙල් සමාගම එකතු වූ අතර රට තුළ ඛනිජ තෙල් නිෂ්පාදන බෙදා හැරීමේ ක්‍රියාවලියේ නිරත වී සිටී. කෙසේවුවද තවමත් එකම බොර තෙල් ආනයනකරු වන්නේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවයි.

**1.8 වගුව** ඛනිජ තෙල් නිෂ්පාදන බෙදා හැරීමේ මධ්‍යස්ථාන 2013

| අංකය | පළාත | ලං.ඛ.නී.ස. මධ්‍යස්ථාන | ලං.ඉ.තෙ.ස. මධ්‍යස්ථාන | එකතුව |
|---|---|---|---|---|
| 01 | බස්නාහිර පළාත | 244 | 65 | 309 |
| 02 | මධ්‍යම පළාත | 86 | 07 | 93 |
| 03 | දකුණු පළාත | 123 | 18 | 141 |
| 04 | උතුරු පළාත | 176 | 08 | 184 |
| 05 | නැගෙනහිර පළාත | 130 | 05 | 135 |
| 06 | වයඹ පළාත | 146 | 08 | 154 |
| 07 | උතුරුමැද පළාත | 70 | 10 | 80 |
| 08 | ඌව පළාත | 36 | 14 | 50 |
| 09 | සබරගමුව පළාත | 63 | 23 | 86 |
| | එකතුව | **1,074** | **158** | **1,232** |

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (ලං.ඛ.නී.ස.) හා ලංකා ඉන්දියානු තෙල් සමාගම (ලං.ඉ.තෙ.ස.)

**1.9 වගුව** විදුලිබල නිෂ්පාදනාගාර සඳහා ලං.ඛ.නී.ස. වේ විකුණුම් 2008-2013

| වර්ෂය | විකුණුම් | | | | විකුණුම්වල එකතුව | |
|---|---|---|---|---|---|---|
| | ලංකා විදුලි බල මණ්ඩලය | | පෞද්ගලික විදුලි බලාගාර | | | |
| | ප්‍රමාණය (ලීටර දහස්වලින්) | වටිනාකම (රු.මිලියන) | ප්‍රමාණය (ලීටර දහස්වලින්) | වටිනාකම (රු.මිලියන) | ප්‍රමාණය (ලීටර දහස්වලින්) | වටිනාකම (රු.මිලියන) |
| 2008 | 513,941 | 36,565 | 859,653 | 62,786 | 1,373,594 | 99,351 |
| 2009 | 575,046 | 27,781 | 930,125 | 32,824 | 1,505,171 | 60,605 |
| 2010 | 364,692 | 17,942 | 808,827 | 33,156 | 1,173,519 | 51,098 |
| 2011 | 454,404 | 26,964 | 943,291 | 47,397 | 1,397,695 | 74,361 |
| 2012 | 544,615 | 47,839 | 1,095,049 | 78,925 | 1,639,664 | 126,764 |
| 2013 | 296,909 | 26,972 | 430,491 | 37,325 | 727,400 | 64,297 |

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (ලං.ඛ.නී.ස.)

1.10 වගුව

## නැව් තෙල් වෙළඳම 2008-2013

| අංකය | ආයතනය | විකුණුම් (මෙ.ටො.) | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
| 1 | ලංකා මැරයින් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් | * | 81,136 | 149,829 | 170,213 | 130,433 | 137,280 |
| 2 | ලංකා මැරිටයිම් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් | 24,852 | 39,951 | 74,962 | 92,130 | 73,137 | 62,660 |
| 3 | ලංකා බන්කරින් ප්‍රයිවට් ලිමිටඩ් | * | 1,631 | 1,315 | 1,250 | 4,470 | 1,748 |
| 4 | ලංකා ඉන්දියානු තෙල් සමාගම | 2,958 | 113,387 | 99,702 | 103,695 | 120,421 | 72,557 |
| 5 | ඉන්ටර් ඕෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් | 8,544 | 3,604 | 11,723 | 19,728 | 9,027 | 38,008 |
| 6 | මොබිසිටි ප්‍රයිවට් ලිමිටඩ් | 216 | 893 | * | 584 | 67 | 3,062 |
| 7 | සීඑස්සී කන්ඩියා ප්‍රයිවට් ලිමිටඩ් | 377 | 1,376 | 5,113 | * | * | * |
| 8 | තලීනා ෂිපින් ප්‍රයිවට් ලිමිටඩ් | * | * | * | * | * | * |
| 9 | මාරියා ෂිපින් ප්‍රයිවට් ලිමිටඩ් | * | * | * | 22 | * | * |
| 10 | මැක් මැරයින් ප්‍රයිවට් ලිමිටඩ් | * | * | * | * | * | * |
| 11 | ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම | * | * | * | * | * | 43,523 |
| 12 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | * | * | * | * | * | - |
| එකතුව | | **36,947** | **241,978** | **342,644** | **387,622** | **337,555** | **358,838** |

මූලාශ්‍රය: ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය
සටහන: *මෙහෙයුම් සිදු කර නැත

# II කොටස

# කාර්යසාධනය

## 2. කාර්යසාධනය

### 2.1 ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම යන ආයතනවල ප්‍රධාන ගණන් දීමේ නිලධාරී ලෙස ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය එම ආයතන දෙක සමඟ එක්ව අදාළ සියලු ප්‍රතිපත්ති, ක්‍රියාමාර්ග, නිර්දේශ සහ සංවර්ධන ව්‍යාපෘති නිර්මාණය කරමින් සහ ඒවා ක්‍රියාත්මක කරමින් අරමුණු සහ ඉලක්ක ළඟා කර ගැනීමට අවශ්‍ය කටයුතු කරනු ලබයි. ඒ අනුව 2013 වර්ෂය තුළ දී ඉහත ආයතන දෙකෙහි සහයෝගයෙන් මෙම අමාත්‍යාංශය විසින් ගනු ලැබූ ප්‍රධාන ප්‍රතිපත්තිමය තීරණ සහ සම්පාදනය කරනු ලැබූ ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

#### අ) තෙල් මිලදී ගැනීම

රටේ ඛනිජ තෙල් අවශ්‍යතාව සපුරාලීම වෙනුවෙන් පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන සහ බොර තෙල් ආනයනය සඳහා සාමාන්‍යයෙන් වර්ෂයක දී දරනු ලබන වියදම ඇ.ඩො. මිලියන 5,000ක් පමණ වේ. එය රටේ සමස්ත ආනයන වියදමෙන් 25%ක ප්‍රමාණයකි. කෙසේ වුවද, ලංකාවේ විශාලතම ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනකරුවා වන්නේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවයි. එබැවින් ඛනිජ තෙල් ආනයන පිරිවැය සහ ඒ ආශ්‍රිත විදේශ විනිමයන්ගෙන් ඇතිවන බලපෑම අවම කර ගැනීමේ ක්‍රම සහ විධි කෙරෙහි ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සුවිශේෂී වූ අවධානයක් යොමු කිරීමට සිදු වී ඇත.

ලෝක වෙළඳපොළේ තෙල් මිල ගණන් අඛණ්ඩව උච්ඡාවචනයන්ට භාජනය වීමත්, ක්ෂණික මිලදී ගැනීම්වල දී ඉහළ මිලක් ගෙවීමට සිදු වීමත් හේතුවෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් දිගු කාලීන ගිවිසුම් මත තෙල් මිලදී ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත. අවදානම අවම කර ගනිමින් පාරිභෝගික අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි අඛණ්ඩ තෙල් සැපයීමේ හැකියාව මෙමඟින් තහවුරු කරනු ලැබේ. මෙම තත්වය මත පදනම්ව දිගුකාලීන කොන්ත්‍රාත්වලට අනුව තෙල් මිලදී ගැනීම පිණිස සමාගම් කිහිපයක් සමඟ ගිවිසුම් වලට එළඹ ඇත.

#### ආ) ලිහිසි තෙල් වෙළඳම

1994 වර්ෂය දක්වාම ලංකාවේ ලිහිසි තෙල් වෙළඳ මේ ඒකාධිකාරියක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට පැවති අතර 1994 දී ලිහිසි තෙල් වෙළඳ ම ලංකා ලුබ්‍රිකන්ට් සමාගමට විකිණීමේදී වසර 5 ක කාලයක් සඳහා වෙනත් කිසිදු ලිහිසි තෙල් නිෂ්පාදනයක් වෙළඳපොළට ප්‍රවේශ වීමේ අයිතිය අවුරා එම සමාගමට වසර 5 ක පූර්ණ හිමිකම් ලබා දෙන ලදී. එයින් වසර 5 කට පසු ලංකාවේ ලිහිසි තෙල් වෙළඳම ලිහිල්කරණය කිරීමත් සමඟ තරඟකාරී සමාගම් කිහිපයක්ම වෙළඳපොළට ඇතුළු විය. හිතකර තරඟකාරීත්වයක් නිර්මාණය කිරීමේ අභිප්‍රාය පෙරදැරිව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ද නැවත ලිහිසි තෙල් වෙළඳපොළට ඇතුළු විය.

කැමැත්ත ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලිය තුළින් මැලේසියාවේ හයිරැක්ස් ඔයිල් සමාගම (Hyrax Oil SDN BHD, Malaysia) ලිහිසි තෙල් වෙළඳම සඳහා තෝරා ගන්නා ලද අතර 2008 ජූලි 01 දින සිට බල පැවැත්වෙන පරිදි වසර 5ක් ක්‍රියාත්මක වීම සඳහා ගිවිසුම් ගත වන ලදී. එම ගිවිසුම් අනුව මැලේසියාවේ හයිරැක්ස් ඔයිල් සමාගම එම රටෙහි ලිහිසි තෙල් වර්ග රාශියක් "හයිරැක්ස් - සිපෙට්කෝ" යන සන්නම් නාමයෙන් නිෂ්පාදනය කරන අතර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් එම නිෂ්පාදන මිලදී ගෙන තරඟකාරී මිල ගණන් යටතේ ශ්‍රී ලංකාවේ බෙදා හැරීම් සිදු කරනු ලබයි. වර්තමානයේ දෙවන විශාලතම ලිහිසි තෙල් ව්‍යාපාරිකයා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වන අතර එය සංස්ථාවට ලාභදායී ව්‍යාපාරයක් බවට පත්ව ඇත. එබැවින් 2014 ජූනි 30 දක්වා ඉහත ගිවිසුම වර්ෂයකින් දීර්ඝ කරන ලදී.

දේශීය හා විදේශීය වෙළඳපොළෙහි ලිහිසි තෙල් අවශ්‍යතාවය සපුරාලීම සඳහා ශ්‍රී ලංකාව තුළ ලිහිසි තෙල් මිශ්‍ර කිරීමේ කර්මාන්ත ශාලාවක් පිහිටුවීමට මැලේසියාවේ හයිරැක්ස් ඔයිල් සමාගම විසින් යෝජනාවක් ඉදිරිපත් කර ඇත. ඒ සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ඉහත සමාගම සමඟ සාකච්ඡා කර ගත් පරිදි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ හයිරැක්ස් ඔයිල් සමාගමේ හවුල් ව්‍යාපාරයක් ලෙස එම කර්මාන්තශාලාව ඉදි කිරීම සුදුසු බවටත් එය ආයෝජන මණ්ඩලයේ සමාගමක් ලෙස සමස්ත ආයෝජනය ඇ.ඩො. මිලියන 09ක වියදමින් සිදු කිරීමටත් එකඟ වී ඇත. දේශීය අගය එකතු කිරීම් සහ රැකියා උත්පාදනයන් මෙන්ම විදේශ විනිමය

ඉපයීම් සලකා බලා ඒ සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවශ්‍ය අනුමැතිය ලබා දුන් අතර ඒ සඳහා ස්ථාවර අමාත්‍ය මණ්ඩල සමාලෝචන කමිටු නිර්දේශය ද ලැබී ඇත. මෙම හවුල් ව්‍යාපාරය ශ්‍රී ලංකාව තුළ ආරම්භ කිරීම සඳහා අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගනු වස් අමාත්‍යාංශය කටයුතු කරනු ඇත.

### ඇ) තෙල් පිරිපහදුව නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය

ලංකාවේ දැනට ක්‍රියාත්මක සපුගස්කන්ද තෙල් පිරිපහදුව 1969 දී ස්ථාපිත කරන ලද්දකි. එමඟින් මෙරට පවතින වත්මන් ඛනිජ තෙල් අවශ්‍යතාවයෙන් දළ වශයෙන් 35 - 40%ක ප්‍රමාණයක් ආනයනය කරන ලද බොර තෙල් දේශීය වශයෙන් පිරිපහදු කිරීම මඟින් සපුරනු ලබයි. ආනයනික පිරිපහදු තෙල්වල මිල හා සසඳන කල දේශීයව පිරිපහදු කර ගැනීම මගින් විශේෂ වාසි රාශියක් අත් කර ගත හැකි බව පෙනී යයි. ඒවා අතරින් රටේ බලශක්ති සුරක්ෂිතතාව තහවුරු කිරීමට හැකි වීම, විදේශ විනිමය ඉතිරි කර ගැනීමට හැකි වීම තුළින් රටේ ආර්ථික වර්ධනය වැඩි කිරීමට දායක වීම, ආනයනික පිරිපහදු තෙල්වල ගුණාත්මක භාවය පිළිබඳ පවත්නා ගැටළු අවම කර ගැනීමට හැකි වීම යනාදිය ප්‍රධාන වෙයි. එපමණක් නොව, තෙල් ආනයනය කිරීම සඳහා දරනු ලබන විශාල වූ පිරිවැය අවම කරගැනීමට හැකි වීම තුළින් රටේ ආර්ථිකයට පවත්නා අසීරුතාව යම් මට්ටමකට අවම කර ගත හැකි වීම ජාතියේම ප්‍රශංසාවට භාජනය වීමට තුඩු දෙන්නකි. එබැවින්, ආනයනික බොර තෙල් දේශීයව පිරිපහදු කිරීම තුළින් තෙල් නිෂ්පාදනය ආර්ථික වශයෙන් වාසි දායක තත්වයකි. එසේ වුවද මූලික පහසුකම්වලින් සමන්විත (Hydroskiming Type) වර්තමානයේ පවත්නා සපුගස්කන්ද තෙල් පිරිපහදුව ඕනෑම බොර තෙල් වර්ගයක් පිරිපහදු කිරීමට හැකි ඉහළ තාක්ෂණික මෙවලම් සහිතව (Hydrocrackers) නවීකරණය කිරීමේ අවශ්‍යතාව පවතී. පිරිපහදුව නවීකරණය කිරීම තුළින් එහි මෙහෙයුම් ලාභදායීත්වය වර්ධනය කර ගැනීමටත්, බොර තෙල් වැඩි පුර ප්‍රමාණයක් භාවිතා කිරීමට හැකි වීමෙන් පිරිපහදු ක්‍රියාවලියේ නම්‍යතාවය වර්ධනය කර ගැනීමටත්, මිල අඩු මට්ටමක පවතින බර බොර තෙල් (Heavy Crude Oil) පිරිපහදුව සඳහා භාවිතා කිරීමටත් හැකියාව ලැබේ. එසේම මෙම නවීකරණය තුළින් මෙහෙයුම් ක්‍රියාවලියේ පවත්නා ආන්තික බව අවම කරන අතර ඉරාන සැහැල්ලු බොර තෙල් සහ සවුදි සැහැල්ලු බොර තෙල් වැනි සැහැල්ලු බොර තෙල් පමණක් පිරිපහදු කිරීමේ සීමාවන් ද අවම කර ගත හැකිය. ඇමෙරිකා එක්සත් ජනපදය විසින් ඉරානයට එරෙහිව පනවන ලද සම්බාධක හේතුවෙන් ඉරාන් සැහැල්ලු බොර තෙල් වෙනුවට වෙනත් රටවලින් සැහැල්ලු බොර තෙල් ගෙන්වීමට සිදු වීම මත ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගැටළුකාරී තත්වයන්ට මුහුණ දීමට සිදු වූ අතර පිරිපහදුව නවීකරණය කිරීම, එවැනි ගැටළුකාරී තත්වයන් මගහරවා ගැනීමට ද වැදගත් වේ.

ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව එක්ව සපුගස්කන්ද තෙල් පිරිපහදුව නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය සකස් කර ඇති අතර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ඉදිරිපත් කර ඇති ඉංජිනේරුමය ඇස්තමේන්තුවට අනුව එහි පිරිවැය ඇ. ඩො. මිලියන 1,500ක් පමණ වේ. වර්තමානය වන විට යෝජිත නවීකරණය සිදු කිරීමට ස්ථාවර අමාත්‍ය මණ්ඩල සමාලෝචන කමිටුව තුළින් සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම සඳහා ව්‍යාපෘති යෝජනා ලබා ගනිමින් සිටී.

#### ඔක්ටේන් 92 පෙට්‍රල් හඳුන්වා දීම

ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයේ මාර්ගෝපදේශකත්වය යටතේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් වර්තමානයේ රටේ පෙට්‍රල් වාහන සඳහා සාමාන්‍යයෙන් භාවිතා කරනු ලබන ඔක්ටේන් 90 පෙට්‍රල්වල යෝග්‍යතාව පිළිබඳ සලකා බලන විට පර්යේෂණ ඔක්ටේන් අංකයෙහි (RON) ප්‍රමාණවත්බව පිළිබඳ විමර්ශනය කිරීමේ අවශ්‍යතාවය පැන නැගී තිබුණි. එබැවින් ජාත්‍යන්තර තත්වයන්ට අනුව ශ්‍රී ලංකාවේ අලෙවි කිරීම සඳහා වඩාත් යෝග්‍ය පෙට්‍රල් වර්ගයක පිරිවිතර පිළිබඳව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විමර්ශනය කරන ලදී. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ඛනිජ තෙල්වල පිරිවිතර යාවත්කාලීන කිරීම සඳහා තාක්ෂණික පිරිවිතර කමිටුවක් පත් කර තිබේ. කලාපීය තෙල් සැපයුම් දාමයේ ස්වභාවය හා රටේ පෙට්‍රල් වාහන සඳහා අවශ්‍ය පෙට්‍රල්වල ගුණාත්මක තත්වය සැලකිල්ලට ගනිමින් ඔක්ටේන් 90 පෙට්‍රල් වෙනුවට ඔක්ටේන් 92 පෙට්‍රල් හඳුන්වාදීම වඩාත් යෝග්‍ය බවට යථෝක්ත කමිටුව එකඟ වුණි.

පිරිපහදුවේ පෙට්‍රල් නිෂ්පාදනය සහ මුසු කිරීමේ ක්‍රියාවලිය තුළින් ඔක්ටේන් 92 පෙට්‍රල් පිරිවිතර සමඟ පිරිපහදුවට අනුකූල විය හැකි බව ද ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් තහවුරු කරන ලදී. තවද

දේශීය වෙළඳපොළේ ඔක්ටේන් 92 පෙට්‍රල් භාවිතා කිරීමෙන් පහත සඳහන් වාසි අත්කර ගත හැකිය.

- ❖ ජාත්‍යන්තර වෙළඳපොළේ ඔක්ටේන් 92 පෙට්‍රල් මිලදී ගැනීමට තිබේ. එම නිසා දේශීය වෙළඳපොලට ඔක්ටේන් 92 පෙට්‍රල් හඳුන්වා දීමත් සමගම ඔක්ටේන් 90 පෙට්‍රල් නිපදවීම සඳහා ඔක්ටේන් 92 පෙට්‍රල්, අනෙකුත් උප ප්‍රාමාණික තෙල් සමඟ මුසු කිරීමේ ක්‍රියාවලිය ඉවත් කළ හැකි වීම.
- ❖ වාහන එන්ජින් ක්‍රියාකාරීත්වයේ වැඩිදියුණු වීමේ ප්‍රතිඵලයක් ලෙස තෙල් පිරිමැස්මක් ඇති වීම.
- ❖ එන්ජින් ගැස්සුම අඩු වීම නිසා ධාවන කිරීමේදී වැඩි වේගයකින් සුමටව ධාවනය කිරීමේ හැකියාව පැවතීම.
- ❖ එන්ජිම ක්ෂයවීම, අධික රත්වීම අඩු කිරීම, ඔක්ටේන් අගය අඩු වීමෙන් එන්ජිමේ ගැස්සුම නිසා ඇති වන හානිකර ප්‍රතිඵල අවම වීමෙන් ඒන්ජිමේ කොටස් සහ එහි ආයු කාලය වැඩි වීම
- ❖ ඉන්ධන දහනය වැඩි දියුණු වීමේ ප්‍රතිඵලයක් ලෙස වාහනවලින් පිට කරන දුම අඩු වීමෙන් වායු දූෂණය අඩු වීම.

ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා එක්ව 2014 ජනවාරි මස 01 වන දින සිට ඔක්ටේන් 90 පෙට්‍රල් වෙනුවට ඔක්ටේන් 92 පෙට්‍රල් දේශීය වෙළඳපොළට හඳුන්වා දීමට අවශ්‍ය සියලු පියවර ගෙන ඇති අතර මේ සඳහා කැබිනට් අනුමැතියද ලබා ගන්නා ලදී. එසේම දේශීය වෙළඳපොළේ අනෙක් තෙල් සැපයුම්කරු වන ලංකා ඉන්දියානු තෙල් සමාගමට ද යෝජිත වෙනසක්ම් පිළිබඳ මේ වන විටත් දන්වා ඇත.

**ඈ) රට හරහා දිවෙන නළ මාර්ග ව්‍යාපෘතිය**

පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්, ගුවන් යානා ඉන්ධන (Jet A-1) සහ දැවි තෙල් ගොඩබිමට බෑම සඳහා කොළඹ වරායේ පිහිටි ඩොල්පින් ජැටිය භාවිතා කරනු ලබන අතර කොළඹ වරායේ සිට කොලොන්නාව තෙල් ගබඩා සංකීර්ණය වෙත මෙම ඛනිජ තෙල් රැගෙන ඒම සඳහා භාවිතා කරනුයේ අඟු. 40 ක් සහ 70 ක් පමණ පැරණි නල පද්ධතියකි. රටේ අනාගත අඛණ්ඩ තෙල් සැපයුමක් සඳහා මෙම නල පද්ධතිය කඩිනමින් නවීකරණය කිරීම අත්‍යාවශ්‍ය වී ඇත. මෙම තෙල් නල පද්ධතිය කොළඹ වරායේ සිට කොලොන්නාව තෙල් ගබඩා සංකීර්ණය දක්වා තෙල් ප්‍රවාහනය සඳහා 1940 ගණන්වල ඉදි කරන ලද්දකි. පැල්පත් වාසීන් නීති විරෝධී ලෙස නල පද්ධති පිහිටා ඇති රක්ෂිත ඉඩම් තුළ පදිංචි වීම මත එම නලවල නඩත්තු කටයුතු හා පිළිසකර කිරීම් සිදු කිරීමට නොහැකි වීම හේතුවෙන් තෙල් නළ මාර්ග දෙකක් මීට වසර ගණනකට පෙර භාවිතයෙන් ඉවත් කර ඇත.

1969 දී සපුගස්කන්ද තෙල් පිරිපහදුව ආරම්භ කිරීමත් සමඟ තවත් නල මාර්ග දෙකක් ඉදි කරන ලදී. ඛනිජ තෙල් ප්‍රවාහන නළ මාර්ගවල අපේක්ෂිත ජීවන කාලය අවු. 25ක් වුවද, අවු. 70ක් සහ අවු. 43ක් පැරණි නළ මාර්ග හරහා තවමත් ආනයනික පිරිපහදු තෙල් සහ බොර තෙල් ප්‍රවාහනය කරනු ලැබේ.

රටේ ඛනිජ තෙල් අවශ්‍යතාවයෙන් විශාල ප්‍රමාණයක් මෙම අබලන් නළ මාර්ග ඔස්සේ කොලොන්නාව තෙල් ගබඩා සංකීර්ණය වෙත රැගෙන යන හෙයින් මෙම නළ මාර්ග පද්ධතිය නවීකරණය කිරීමේ අවශතාවය පැන නැගී ඇත.

ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතිය සම්බන්ධව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කරනු ලබයි. මේ වන විට ඒ සඳහා අවශ්‍ය මූලික පියවරයන්, එනම් භූමි ලක්ෂණ සමීක්ෂණය, භූගෝලීය සමීක්ෂණ, මූලික පාරිසරික පරීක්ෂණය, වඩාත් යෝග්‍ය නළ එළීමේ මාර්ග හඳුනා ගැනීම, ඉන්ධන ප්‍රවාහන නළ මාර්ග අවට අනවසර නිවෙස්වල පදිංචිව සිටි පවුල්වලින් කොටසක් නැවත පදිංචි කිරීමට අදාල වන්දි ගෙවීම ආදී කටයුතු අවසන් කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයා ගැනීමේ කටයුතු සහ වඩාත් සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. මෙම අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාමාර්ග සහ ප්‍රතිපත්තිමය තීරණ කිහිපයක් ගෙන ඇත. කෙසේ වුවද පැල්පත් වාසීන් අදාළ ස්ථානවලින් ඉවත් කිරීමේදී විරෝධය පළ කිරීම වැනි සාමාජීය හා භෞතික ගැටළු කිහිපයක් ද පැන නැගීම මත ව්‍යාපෘතියේ මූලික කාර්යයන් නිම කිරීම ප්‍රමාද විය.

මෙම ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා විකල්ප ක්‍රියාමාර්ග සලකා බලන ලදුව ස්ථාවර අමාත්‍ය මණ්ඩල සමාලෝචන කමිටුවේ (SCARC) ඇගයීම් ක්‍රියාවලිය තුළින් තාක්ෂණික වශයෙන් සුදුසුකම් ලත් මූල්‍ය වශයෙන් සඵලදායී ව්‍යාපෘති යෝජනාවක් තෝරා ගැනීම සුදුසු බවට තීරණය කර ඇත.

### අපේක්ෂිත ප්‍රතිලාභ

- ❖ කොළඹ වරායේ සිට කොළොන්නාව දක්වා බනිජ තෙල් ප්‍රවාහනය කාර්යක්ෂමව සිදු කිරීම.
- ❖ බනිජ තෙල් නිමි භාණ්ඩයක් ලෙස පාරිභෝගිකයා වෙත ළඟා වන තුරු ඒවායේ ගුණාත්මක භාවය පවත්වා ගැනීම.
- ❖ අනාගත වැඩි වන ඉල්ලුම සපුරාලීමට හැකියාව ලැබීම සහ අඛණ්ඩ සේවාව තහවුරු කිරීම.
- ❖ ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව හා ලංකා බනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමට සිදු වන තොග හීන වීමේ පාඩු සහ මූල්‍ය පාඩු අවම වීම.
- ❖ අබලන්ව ඇති නළ මාර්ග නඩත්තු කිරීමේ පිරිවැය අවම වීම.

### ඉ) බනිජ තෙල් තොග ගබඩා ටැංකි ඉදි කිරීමේ ව්‍යාපෘතිය

වාර්ෂික ඉන්ධන ඉල්ලුම 5% ක් දක්වා වැඩි වීම මත සෑම බනිජ තෙල් නිෂ්පාදනයක්ම අවශ්‍ය ප්‍රමාණයන්ගෙන් තොග වශයෙන් ගබඩා කර තබා ගැනීමේ පහසුකම වර්ධනය කරගත යුතුය. තෙල් ගබඩා කිරීමේ හා දිවයින පුරා බෙදා හැරීමේ වගකීම පැවරී ඇත්තේ ලංකා බනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම වෙත බැවින්, මෙම සමාගම විසින් කොළොන්නාව, මුතුරාජවෙල ප්‍රධාන තෙල් තොග ගබඩා සංකීර්ණයන්හි මෙ.ටො. 100,000 ක තෙල් නිෂ්පාදන ගබඩා පහසුකම් පුළුල් කිරීම සඳහා පියවර ගෙන ඇත. ඕනෑම අවස්ථාවකදී රට තුළ දින 30කට ප්‍රමාණවත් තෙල් තොගයක් පවත්වා ගැනීමට හැකි වන පරිදි ආනයනය කරනු ලබන නිෂ්පාදන හා පිරිපහදුවේ නිෂ්පාදන ගබඩා කිරීමට අවශ්‍ය ගබඩා පහසුකම් ඇති කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ.

### අපේක්ෂිත ප්‍රතිලාභ

- ❖ දිවයින පුරා අඛණ්ඩ තෙල් සැපයුම තහවුරු කිරිමට හැකි වීම.
- ❖ රටේ ඉන්ධන අවශ්‍යතාවට ගෙන්වනු ලබන බනිජ තෙල් නැව් තොග, ගබඩා කිරීමට හැකියාව ලැබීම සහ නැව් ප්‍රමාද ගාස්තු අවම කර ගැනීමට හැකි වීම.
- ❖ අනපේක්ෂිත අවස්ථාවලදී ඇති විය හැකි අවදානම අවම කරමින් තිරසාර අයුරින් තොග පවත්වාගැනීමට හැකි වීම හා විවිධ විශේෂිත අවස්ථා සඳහා වන අවශ්‍යතාවයන් සපුරාලීමට හැකි වීම.

### ඊ) බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ගුවන් යානා ඉන්ධන සැපයුම් පද්ධතිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ දෙවන අදියරේ දෙවන මට්ටම සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ, ගුවන් යානා ඉන්ධන ගබඩා කිරීමේ පහසුකම් සංවර්ධනය කිරීම සඳහා බනිජ තෙල් නීතිගත සංස්ථාව සමඟ එක්ව අමාත්‍යාංශය විසින් අවශ්‍ය පියවර ගෙන ඇත. ඉන්ධන ගබඩා කිරීමේ අතිරේක පහසුකම් සංවර්ධනය කිරීම, අතිරේක ඉන්ධන සැපයුම් පද්ධතියක් ඉදි කිරීම සහ පවත්නා ඉන්ධන සැපයුම් පද්ධතිය නවීකරණය කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචකයක් වේ. 2013 වර්ෂයේදී සිදු කරන ලද ඉංජිනේරු ඇස්තමේන්තුවට (තාවකාලික) අනුව මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත පිරිවැය ඇ.ඩො. මිලියන 45ක් පමණ වේ. අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගමේ සහාය ඇතිව ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

### උ) එක් අන්ත නැංගුරම්පොළ බෝයා පද්ධතියේ (SPBM) තත්ත්ව පරීක්ෂාව පිළිබඳ ව්‍යාපෘතිය

සපුගස්කන්ද පිරිපහදුවට අවශ්‍ය බොර තෙල් ගොඩබිමට බෑම සඳහා භාවිතා කරනු ලබන එක් අන්ත නැංගුරම්පොළ බෝයා පද්ධතිය 1987 වර්ෂයේ දී ස්ථාපනය කරන ලද අතර එය දැනට අවු. 25කට වඩා පැරණිය. කොළඹ වරායේ සිට කි.මී. 9.2ක් පමණ දුර මුහුදේ මෙම බොර තෙල් බෝයාව පිහිටා ඇති අතර මෙම බෝයාවේ නිෂ්පාදන බෙදා හැරීමේ ඒකකය සෑම අවු. 5 කට වරක් අළුත්වැඩියා කළ යුතු අතර අවසන් වරට අළුත්වැඩියාව සිදු කර ඇත්තේ 2008 වර්ෂයේදීය. එබැවින්, 2015 දී සිදු කිරීමට නියමිත මීලඟ අළුත්වැඩියාවට පෙර මෙහි තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා ඒකාබද්ධ ඇගයීමක් ස්වාධීන පාර්ශවයක් හරහා ඉදිරි වර්ෂයේ මාර්තු මාසයේදී සිදු කර ගැනීමට සැලසුම් කර ඇත.

### ඌ) ඩොල්පින් ජැටිය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය

ලංකා බනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ කොළොන්නාව තෙල් ගබඩා සංකීර්ණය වෙත රැගෙන එන ආනයනික බනිජ තෙල් ගොඩබෑමට ඩොල්පින් ජැටිය භාවිතා කරනු ලබන අතර එමගින් ශ්‍රී ලංකාවේ බනිජ තෙල් කර්මාන්තයේ නියැලෙන සියළු සමාගම් සඳහා පොදු පහසුකම් සපයනු ලබයි. මෙම පහසුකම

අළුත්වැඩියාව සහ නඩත්තුව සම්බන්ධයෙන් දීර්ඝ කාලයකින් ගැඹුරු අධ්‍යයනයක් සිදු කර නොමැත. රටේ ඛනිජ තෙල් අවශ්‍යතාවය සපුරාලීමට මුතුරාජවෙල සහ චීන වරායේ පිහිටි තෙල් ගොඩ බෑමේ පහසුකම් ප්‍රමාණවත් නොවන අතර අළුත්වැඩියා සහ නඩත්තු කටයුතු නොකිරීම මත ඩොල්ෆින් ජැටියේ ක්‍රියාකාරිත්වය ඇණ හිටීම තුළින් රටේ ඛනිජ තෙල් අවශ්‍යතාව අඛණ්ඩව සපුරාලීමේ ඍජු අවදානමක් පවතින බව පැහැදිලිය. මෙම ව්‍යාපෘතිය, යෝජිත ව්‍යාපෘතියක් වන කොළඹ වරායේ සිට කොළොන්නාව දක්වා නළ මාර්ග දෙකක් ඉදි කිරීම ඔස්සේ (රට හරහා දිවෙන නළ මාර්ග ව්‍යාපෘතිය) සමාන්තරව ක්‍රියාත්මක කළ යුතු වන අතර එමගින් තෙල් ගොඩ බෑමේදී ඇති විය හැකි ගැටළු සහගත තත්වයන් මගහරවා ගත හැකි වනු ඇත. මෙම ව්‍යාපෘතිය ලබන වසරේ දී ප්‍රමුඛතාවය දී ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘතියක් ලෙසින් හඳුනාගෙන ඇත.

### එ) නව තෙල් තොග ගබඩාවක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය

වර්තමානයේ උතුරු පළාතේ පවතින තෙල් තොග ගබඩාව කන්කසන්තුරේ සිමෙන්ති සංස්ථාව පිහිටි භූමියේ පිහිටා ඇති අතර සිමෙන්ති සංස්ථාව විසින් මෙම තෙල් තොග ගබඩාව එම ස්ථානයෙන් ඉවත් කර ගන්නා ලෙසට 2011 වර්ෂයේ දී ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම වෙත දන්වා ඇත. උතුරු පළාතේ පාරිභෝගිකයන්ට අවශ්‍ය ඉන්ධන අඛණ්ඩව සැපයීම තහවුරු කරනු වස් එම පළාතේ වෙනත් ස්ථානයක ගබඩාවක් ඉදි කිරීම ප්‍රමුඛ ව්‍යාපෘතියක් ලෙස ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම හඳුනාගෙන ඇත.

**අපේක්ෂිත ප්‍රතිලාභ**

- ❖ උතුරු පළාතේ අඛණ්ඩ තෙල් සැපයුම තහවුරු කිරීම.
- ❖ නියමිත පාරිසරික ආරක්ෂණ ක්‍රමවේද පිළිපැදීම.
- ❖ යුද්ධය නිමා වීමත් සමග ආරම්භ කර ඇති සංවර්ධන වැඩසටහන් දියත්කිරීම සඳහා කර්මාන්ත කරුවන්ට අවශ්‍ය ඉන්ධන අඛණ්ඩව සැපයීමට හැකි වීම.
- ❖ දුම්රිය භාවිතය මගින් ඉන්ධන ප්‍රවාහන පිරිවැය අවම කිරීමට හැකි වීම.
- ❖ උසස් ගුණාත්මකභාවයෙන් යුතු ඉන්ධන අඛණ්ඩව සැපයීම තුළින් පාරිභෝගික විශ්වාසය දිනා ගත හැකි වීම.

### ඒ) ඉන්ධන තොග ගබඩා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

බ්‍රිතාන්‍ය පාලන කාලයේ විවිධ පළාත්වලට ඉන්ධන දුම්රියෙන් ප්‍රවාහනය කිරීම පදනම් කර ගනිමින් ප්‍රාදේශීය ඉන්ධන තොග ගබඩා ඉදිකිරීම ආරම්භ විය. මෙම තොග ගබඩාවලට තෙල් පිරවීම මුළුමනින්ම දුම්රිය මගින් ප්‍රවාහනය කිරීමෙන් සිදුකරන ලදී. මෙම ක්‍රමය ආරම්භ කරන ලද 1935 වර්ෂයේ සිට මේ දක්වා සලකා බලන ලද බොහොමයක් උපාය මාර්ගික සාධකයන් ඉන්ධන අවශ්‍යතාවය, අදාළ සංකල්පයන් සහ ක්‍රමවේද බ්‍රිතාන්‍ය පාලන යුගයට සාපේක්ෂව වර්තමානය වන විට වෙනස් වී ඇති බව පැහැදිළිය. වර්තමානයේ ඉන්ධන ප්‍රවාහනය සඳහා භාවිතා කරනු ලබන බවුසර්වලින් එක් වරකට කි.මී. 200 ක් දුරට ප්‍රවාහනය කළ හැකි අතර පැය 10 ත් 12 ත් අතර කාලයක දී ආපසු පැමිණිය හැකිය. ප්‍රාදේශීයව පිහිටි ඉන්ධන තොග ගබඩාවල සිට ඉන්ධන අලෙවිසැල්වලට අවශ්‍ය ඉන්ධන ප්‍රවාහනය සඳහා මහා මාර්ග ඔස්සේ බවුසර් භාවිතා කළ හැකි අතර එමගින් ප්‍රවාහන ගාස්තු ද්විත්වකරණය වීම විශාල වශයෙන් අවම කරගත හැකිය. එසේම දැනට පවත්නා ක්‍රමය අනුව ඉහළ විදුලි භාවිතය, ජලය ප්‍රවාහනය සහ එම ගබඩාවල අතිරික්ත සේවක මණ්ඩලය හේතුවෙන් විශාල පිරිවැයක් දැරීමට සිදුව ඇත. වර්තමාන ජාතික සංවර්ධන වැඩසටහන් සමඟ විශේෂයෙන්ම දකුණු පළාතේ කර්මාන්තපුර ආරම්භ කිරීම, සංචාරක කර්මාන්තය වර්ධනය කිරීම, උතුරු සහ නැගෙනහිර පළාත්වල සීඝ්‍ර සංවර්ධන වැඩ සටහන් දියත් කිරීම සහ නව තාප විදුලි බලාගාර පිහිටුවීම යනාදී සංවර්ධන ක්‍රියාදාමයන් හේතුවෙන් වර්තමාන ඉන්ධන අවශ්‍යතාවය ඉහළ ගොස් ඇත. එබැවින් ප්‍රාදේශීය තොග ගබඩා උපායමාර්ගික ලෙස සුදුසු ස්ථානයන්හි ස්ථාපිත කළ යුතුව ඇත. වර්තමාන හා අනාගත ඉන්ධන අවශ්‍යතාවයන් සපුරාලීමටත්, පාරිභෝගික ඉන්ධන අවශ්‍යතාව අඛණ්ඩව සැපයීම තහවුරු කිරීමටත්, නියමිත ප්‍රමිතීන්ට අනුකූලව ඉන්ධන ලබාදීමටත් හැකිවන පරිදි ප්‍රාදේශීය ඉන්ධන තොග ගබඩාවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ක්‍රමවත් සැලැස්මක් දියත්කිරීම කාලීන අවශ්‍යතාවයක්ව පවතී.

**අපේක්ෂිත ප්‍රතිලාභ**

- ❖ ගබඩා සහ පිරවුම් පහසුකම් වර්ධනය කිරීම.
- ❖ ගිනිගැනීම් වලක්වාලන ආරක්ෂණ ක්‍රම වැඩි දියුණු කිරීම.
- ❖ ඉන්ධන ප්‍රවාහන පිරිවැය සහ ප්‍රවාහන කාලය අවම කිරීම.

## 2.2 ආනයන සහ පිරිපහදු කිරීම

### 2.2.1 පිරිපහදු කරන ලද බනිජ තෙල් නිෂ්පාදන

අන්තර් රාජ්‍ය පදනමින් ප්‍රධාන තෙල් සැපයුම්කරුවන් සමග ඇතිකර ගත් දිගුකාලීන ගිවිසුම් මත ඉන්ධන ආනයනය කිරීමට අමතරව රටේ ඉන්ධන අවශ්‍යතාව අඛණ්ඩව සපුරාලීම සඳහා ක්ෂණික මිල දී ගැනීම් ද සිදුකිරීමට ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට සිදුවිය. ඇමරිකා එක්සත් ජනපදයෙන් පනවන ලද සම්බාධක හේතුවෙන් පිරිපහදු ක්‍රියාවලිය සඳහා උචිත බොරතෙල් වර්ගය ලබාගැනීමට නොහැකිවීම මත මෙසේ ක්ෂණික මිළදී ගැනීම් සමහරක් සිදු කරන ලදී. කෙටිකාලයක් තුළ ඇණවුම් ඉදිරිපත් කිරීම සහ ඇණවුම් ප්‍රමාණයෙන් කුඩා වීම යන හේතු මත ක්ෂණික මිලදී ගැනීම් තුළින් ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ඉහළ ප්‍රිමියම් අගයක් ගෙවූ අවස්ථාද පවතී. මෙවැනි තත්වයක් පැවතියද, සංස්ථාවට ප්‍රතිලාභ ගෙන දෙන දිගුකාලීන ගිවිසුම් අත්සන් කිරීමටත්, එසේම පැවති ගිවිසුම්වල කාලය දීර්ඝ කිරීමටත් හැකිවිය. කෙසේ වෙතත් 2013 වර්ෂයේ පැවති ඉහළ වර්ෂාපතනය හේතුවෙන් සංස්ථාවට ප්‍රතිලාභයක් ගෙනදෙන දැවි තෙල් විදුලිබල උත්පාදනය සඳහා භාවිතය සැලකිය යුතු ප්‍රමාණයකින් පහළ වැටුණු අතර එබැවින් ඒවා ආනයනයද පහළ වැටුණි. 2012 සහ 2013 වර්ෂයන්හි දී ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව මගින් ආනයනය කරන ලද පිරිපහදු බනිජ තෙල් නිෂ්පාදන පිළිබඳ විස්තර 2.1 වගුව මගින් පෙන්වයි.

**2.1 වගුව** ලං.බ.නී.ස. විසින් ආනයනය කරන ලද පිරිපහදු බනිජ තෙල් නිෂ්පාදන 2012-2013

| නිෂ්පාදන වර්ගය | 2012 | | 2013 | |
|---|---|---|---|---|
| | ප්‍රමාණය බැරල් '000 | මෙ.ටො.000 | ප්‍රමාණය බැරල් '000 | මෙ.ටො.000 |
| ඔටෝ ඩීසල් | 11,357 | 1,509 | 7,554 | 1,031 |
| සුපර් ඩීසල් | 122 | 16 | 216 | 29 |
| පෙට්‍රල් 90 ඔක්ටේන් | 3,249 | 382 | 3,041 | 355 |
| පෙට්‍රල් 92 ඔක්ටේන්* | - | - | 427 | 50 |
| පෙට්‍රල් 95 ඔක්ටේන් | 256 | 30 | 350 | 41 |
| ගුවන් යානා ඉන්ධන | 2,133 | 271 | 2,340 | 296 |
| භූමිතෙල් ** | 55 | 7 | - | - |
| වැඩි සල්ෆර් දැවිතෙල් 180 (CST) ** | 1,496 | 229 | - | - |
| අඩු සල්ෆර් දැවිතෙල් 180 (CST) | 2,179 | 305 | 451 | 69 |
| **එකතුව** | 20,847 | **2,749** | **14,379** | **1,871** |

මූලාශ්‍රය: ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව (ලං.බ.නී.ස.)
සටහන : *2014.01.01 දින සිට ඔක්ටේන් 90 පෙට්‍රල් වෙනුවට ඔක්ටේන් 92 පෙට්‍රල් දිවයින පුරා බෙදාහැරීම සඳහා 2013 වර්ෂයේ අවසාන කාලයේදී ඔක්ටේන් 92 පෙට්‍රල් ආනයනය කරන ලදී.
**2013 වර්ෂයේදී ආනයනය කර නැත.

### 2.2.2 බොර තෙල්

2012 වර්ෂයේ මැද භාගයේ දී ඉරානයට එරෙහිව ඇමරිකා එක්සත් ජනපදය විසින් පනවන ලද සම්බාධක හේතුවෙන් ආර්ථික වශයෙන් වාසිදායක අයුරින් සහ අවම ගැටළු සහිතව තෙල් පිරිපහදු කාර්යය සඳහා හොඳින්ම ගැලපෙන ඉරාන සැහැල්ලු බොරතෙල් වෙනුවට විකල්ප බොරතෙල් වර්ගයක් සොයා ගැනීමට අපහසුවීම මත ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට විවිධ අපහසුතාවයන්ට මුහුණ පෑමට සිදුවිය. එබැවින් සපුගස්කන්ද පිරිපහදුවේ නිෂ්පාදන ක්‍රියාවලියට වඩාත් උචිත බොර තෙල් මිශ්‍රණය සොයා ගැනීම සඳහා බොරතෙල් වර්ග කිහිපයක්ම අධ්‍යයනය කිරීමට සිදුවිය. අවසානයේදී මර්බන් බොරතෙල් 80%ක කොටසක් සහ ඕමාන් බොරතෙල් 20%ක කොටසක මිශ්‍රණයක් යොදාගැනීම ආර්ථික වශයෙන් ප්‍රතිඵලදායී සහ ප්‍රායෝගිකව සුදුසු බව හඳුනා ගන්නා ලදී. නමුත් සාපේක්ෂව මර්බන් බොරතෙල් සඳහා ඉහළ මිලක් ගෙවීමට සිදුවේ. 2.2 වගුව මගින් 2012 සහ 2013 වර්ෂයන්හි දී ආනයනය කරන ලද බොරතෙල් ප්‍රමාණය පෙන්වයි.

| 2.2 වගුව | බොරතෙල් ආනයනය 2012-2013 | |
|---|---|---|
| බොර තෙල් වර්ගය | මුළු ප්‍රමාණය | |
| | මෙ ටො'000 | බැරල් '000 |
| **2012** | | |
| ඉරාන සැහැල්ලු බොර තෙල් | 697.41 | 5,126.07 |
| අරාබි සැහැල්ලු බොර තෙල් | 617.12 | 4,518.83 |
| මර්බන් බොර තෙල් | 86.29 | 658.31 |
| ඕමාන් එක්ස්පෝර්ට් බ්ලෙන්ඩ් | 85.90 | 624.64 |
| **එකතුව** | **1,486.72** | **10,927.85** |
| 2013 | | |
| සැහැල්ලු බොර තෙල් | 221.65 | 1,631.00 |
| මර්බන් බොර තෙල් | 618.53 | 4,711.00 |
| ඕමාන් එක්ස්පෝර්ට් බ්ලෙන්ඩ් | 903.31 | 6,524.00 |
| **එකතුව** | **1,743.49** | **12,866.00** |

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### 2.2.3 කෘෂි රසායනික ද්‍රව්‍ය

තරගකාරී මිල ගණන් යටතේ කෘෂිකර්මාන්තයට සහ වතු අංශයට අවශ්‍ය බොහොමයක් කෘෂි රසායනික ද්‍රව්‍ය සැපයීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හැකි වී ඇත. මෙමගින් දේශීය වෙළඳපොළේ කෘෂි රසායනික ද්‍රව්‍යවල මිල ගණන් පාලනය කිරීමට හැකි වී ඇත. තරගකාරී මිල ගණන් යටතේ වෙළඳපොළට නිෂ්පාදන නිකුත් කිරීමේදී කෘෂි රසායනික ද්‍රව්‍ය තොග බෙදුම්කරුවන්ගේ තරගකාරීත්වය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අභියෝගයක් වී ඇති 2012 සහ 2013 වර්ෂවල දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ආනයනය කරන ලද කෘෂි රසායනික ද්‍රව්‍ය ප්‍රමාණයන් 2.3 වගුව මගින් පෙන්වයි.

| 2.3 වගුව | ලං.ඛ.නී.ස. විසින් ආනයනය කරන ලද කෘෂි රසායනික ද්‍රව්‍ය 2012-2013 | | | |
|---|---|---|---|---|
| නිෂ්පාදන | ප්‍රමාණය | | වටිනාකම (ඇ.ඩො.) | වටිනාකම (රු. මිලියන දේශීය මිලදී ගැනීම්) |
| | ලීටර් | කි. ග්‍රෑම් | | |
| **2012** | | | | |
| ග්ලිෆෝසේට් 36 SL | 96,000 | - | 232,640 | - |
| 3-4 ඩීපීඒ 36% EC | 32,000 | - | 145,600 | - |
| ක්ලෝපිරිෆෝස් 40% EC | 15,000 | - | 64,950 | - |
| කාබොෆියුරාන් 75% WP | - | 5,000 | - | 11.75 |
| කාබරිල් 85% WP | - | 3,000 | 29,850 | - |
| ඩියුරෝන් 80% WP | - | 10,000 | - | 11.09 |
| ඇස්පේට් 75% SP | - | 3,000 | 25,500 | - |
| **එකතුව - 2012** | **143,000** | **21,000** | **498,540** | **22.84** |
| **2013** | | | | |
| මැන්කොසෙබ් 80% WP | - | 28,000 | 77,700 | - |

| | | | | |
|---|---|---|---|---|
| පෙන්තොඒට් 50% EC | 16,000 | - | 120,800 | - |
| ප්‍රොෆෙනොෆොස් 50% EC | 23,000 | - | 134,190 | - |
| එම්සීපීඒ 40% (Na+K) සෝල්ට් | 3000 | - | - | 1.53 |
| ග්ලයිෆෝසේට් 36% SL | 64,000 | - | 203,200 | - |
| ඩියුරෝන් 80% | - | 2,400 | 153,120 | - |
| ඇස්පේට් 75% | - | 5,000 | 42,000 | - |
| බීපීඑම්සී 50% | 8,000 | - | 34,000 | - |
| එම්සීපීඒ 60% | 5,000 | - | - | 3.65 |
| **එකතුව - 2013** | **119,600** | **35,400** | **765,010** | **5.18** |

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (ලං.ඛ.නී.ස.)

### 2.2.4 තාර

තාර අලෙවිය අතීතයේදී වර්ෂ ගණනාවක්ම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ඉහළ ලාභදායීත්වයක් උපයා දුන් ව්‍යාපාරයක්ව පැවතුනි. ප්‍රධානතම තාර සැපයුම්කරුවෙක් වූ ඉරානයට එරෙහිව ඇමරිකා එක්සත් ජනපදය විසින් සම්බාධක පැනවීම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ප්‍රතිලාභ ගෙන දුන් තාර ව්‍යාපාරයටද බලපෑමක් විය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ඉතා ප්‍රබල ලෙස එම සම්බාධකවලට යටත් වීමට සිදුවූ හෙයින් මිළ දී ගැනීමට නොහැකි ආකාරයේ ඉහළ මිල ගණන්වලට මුහුණ දීමට සිදුවිය. 2012 සහ 2013 වර්ෂවල දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්-ථාව විසින් ආනයනය කරන ලද තාර ප්‍රමාණයන් පිළිවෙලින් 2.4 සහ 2.5 වගුවලින් පෙන්වයි.

**2.4 වගුව ලං.ඛ.නී.ස. විසින් ආනයනය කරන ලද තාර - 2012**

| ශ්‍රේණිය | නැව් තොග අංකය | ප්‍රමාණය (මෙ.ටොන්) | වටිනාකම (ඇ.ඩො./ මෙ. ටොන්)* | නිෂ්පාදිත රට |
|---|---|---|---|---|
| 80/100 | AS/01/2012 | 5,000 | 544.00 | එක්සත් අරාබි එමීර් රාජ්‍යය |
| | AS/03/2012 | 3,000 | 529.00 | |
| | AS/05/2012 | 3,000 | 564.50 | |
| | AS/07/2012 | 3,000 | 538.50 | |
| | AS/09/2012 | 3,000 | 542.50 | |
| 60/70 | AS/02/2012 | 5,000 | 544.00 | |
| | AS/04/2012 | 5,000 | 529.00 | |
| | AS/06/2012 | 5,000 | 564.50 | |
| | AS/08/2012 | 5,000 | 538.50 | |
| | AS/10/2012 | 5,000 | 548.50 | |

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
සටහන: * CIF මිල

| 2.5 වගුව | ලං.බ.නී.ස. ආනයනය කරන ලද තාර - 2013 | | | |
|---|---|---|---|---|
| ශ්‍රේණිය | නැව් තොග අංකය | ප්‍රමාණය (මෙ. ටොන්) | වටිනාකම (ඇ.ඩො./ මෙ. ටොන්)* | නිෂ්පාදිත රට |
| 80/100 | AS/01/2013 | 2000 | 554.00 | එක්සත් අරාබි එමීර් රාජ්‍යය |
| | AS/03/2013 | 1,000 | 605.00 | |
| | AS/07/2013 | 3,000 | 614.00 | |
| | AS/09/2013 | 5,000 | 605.50 | |
| | AS/11/2013 | 3,000 | 610.50 | |
| | AS/13/2013 | 3,000 | 579.00 | |
| | AS/16/2013 | 5,000 | 567.00 | |
| 60/70 | AS/02/2013 | 5,000 | 554.00 | |
| | AS/04/2013 | 5,000 | 602.90 | |
| | AS/08/2013 | 5,000 | 608.50 | |
| | AS/10/2013 | 10,000 | 601.50 | |
| | AS/12/2013 | 5,000 | 604.50 | |
| | AS/14/2013 | 3,000 | 579.00 | |
| | AS/15/2013 | 3,000 | 567.00 | |

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
සටහන: * CIF මිල

## 2.3 ගබඩාකිරීම, බෙදාහැරීම සහ අලෙවිය

ඉන්ධන ගබඩා කිරීමේ සහ එම ඉන්ධන දිවයින පුරා බෙදාහැරීමේ කාර්යයන් සිදු කිරීම සඳහා 2013 වර්ෂයේ දී සමාගම් පනත යටතේ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම ස්ථාපිත කරන ලදී. මෙම සමාගමේ කොටස් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවවට 2/3 ක් ද ලංකා ඉන්දියානු තෙල් සමාගමට 1/3ක් ද වශයෙන් වෙන් කර දී ඇත. ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ ප්‍රධාන ගබඩා පර්යන්ත දෙක කොලොන්නාව සහ මුතුරාජවෙල පිහිටා ඇත. දිවයින පුරා පාරිභෝගිකයන්ට අවශ්‍ය ඉන්ධන ලබාදීම විවිධ ප්‍රදේශයන්හි පිහිටි ඉන්ධන තොග ගබඩා 11 ක් මගින් සිදු කරනු ලැබේ. දුම්රිය මගින් සහ බවුසර් මගින් (සමාගමේ බවුසර් සහ කුලී රථ) ප්‍රධාන ගබඩා පර්යන්තවල සිට ප්‍රාදේශීය තොග ගබඩාවලට ඉන්ධන ප්‍රවාහනය කරනු ලැබේ.

සියළුම ප්‍රාදේශීය තොග ගබඩා ඒවායෙහි ධාරිතාව සහ අනාගතයේ දී වර්ධනය කිරීමේ හැකියාව මත කොටස් දෙකකට වෙන් කරනු ලැබේ.

1 පංතිය : පේරාදෙණිය, ගාල්ල, කුරුණෑගල, මඩකලපුව, අනුරාධපුර, බදුල්ල සහ කන්කසන්තුරේ

2 පංතිය : කොටගල, හපුතලේ, මාතර, සරසවි උයන

## 2.6 වගුව ලං.ඛ.තො.ග.ප. සමාගමේ විකුණුම් (කි.ලී.) - 2013

| නිෂ්පාදනය | කොලොන්නාව | මුතුරාජවෙල | ප්‍රාදේශීය තොග ගබඩා |
|---|---|---|---|
| ලංකා පෙට්‍රල් 90 ඔක්ටේන් | 327,936 | 212,392 | 245,294 |
| ලංකා කාර්මික භූමිතෙල් | 18,279 | * | * |
| ලංකා ඔටෝ ඩීසල් | 545,423 | 511,724 | 570,070 |
| ලංකා සුපර් ඩීසල් | 27,423 | * | 2,169 |
| ලංකා භූමිතෙල් | 27,523 | 44,986 | 53,513 |
| ලංකා පෙට්‍රල් 95 ඔක්ටේන් | 56,255 | * | * |
| ලංකා රසායනික නැප්තා | 104,019 | * | * |
| ලංකා දැවිතෙල් තත්පර 800 | 56,911 | * | 1,492 |
| ලංකා දැවිතෙල් තත්පර 1500 (වැඩි සල්ෆර්) | 302,724 | * | * |
| ලංකා දැවිතෙල් තත්පර 1500 (අඩු සල්ෆර්) | * | 101,060 | * |
| ලංකා ඇවගාස් (Avagas) තොග | 1 | * | * |
| ගුවන්යානා ඉන්ධන (Jet A-1) | 5,322 | * | * |
| ලංකා සොල්වන්ට්ස් (SBP) | 3,730 | * | * |
| X Premium Euro 3 | * | * | * |
| X Mile | * | * | * |
| **එකතුව** | **1,475,546** | **870,162** | **872,538** |
| **මුළු විකුණුම් වල ප්‍රතිශතයක් ලෙස** | **46** | **27** | **27** |
| **මුළු එකතුව** | | | **3,218,246** |

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
සටහන: * අදාළ ස්ථානයන්හි විකුණුම් නොමැත

## 2.7 වගුව ලං.ඛ.නී.ස.වේ විකුණුම් (ලීටර් මිලියන) 2012 - 2013

| වර්ගය | සිල්ලර විකුණුම් | | පාරිභෝගික විකුණුම් | | මුළු විකුණුම් | |
|---|---|---|---|---|---|---|
| | 2012 | 2013 | 2012 | 2013 | 2012 | 2013 |
| ලංකා පෙට්‍රල් 90 ඔක්ටේන් | 766.17 | 778.92 | 6.44 | 6.31 | 772.61 | 785.23 |
| ලංකා පෙට්‍රල් 95 ඔක්ටේන් | 35.04 | 50.52 | 5.17 | 5.56 | 40.21 | 56.08 |
| ලංකා ඔටෝ ඩීසල් | 1,545.11 | 1,514.01 | 736.28 | 328.65 | 2,281.39 | 1,842.66 |
| ලංකා සුපර් ඩීසල් | 21.28 | 27.21 | 4.84 | 2.20 | 26.12 | 29.41 |
| ලංකා භූමිතෙල් | 158.53 | 141.39 | 1.42 | 0.92 | 159.95 | 142.31 |
| ලංකා කාර්මික භූමිතෙල් | 1.42 | 1.64 | 20.48 | 16.63 | 21.90 | 18.27 |
| ලංකා රසායනික නැප්තා | - | - | 89.70 | 104.03 | 89.70 | 104.03 |
| ලංකා දැවිතෙල් තත්පර 800 | - | - | 65.49 | 63.81 | 65.49 | 63.81 |
| ලංකා දැවිතෙල් තත්පර 1500 (වැඩි සල්ෆර්) | - | - | 666.55 | 389.02 | 666.55 | 389.02 |
| ලංකා දැවිතෙල් තත්පර 1500 (අඩු සල්ෆර්) | - | - | 227.58 | 153.88 | 227.58 | 153.88 |
| ලංකා දැවිතෙල් තත්පර 3500 | - | - | 291.60 | 95.80 | 291.60 | 95.80 |
| ගුවන් යානා ඉන්ධන (Jet A-1) | - | - | 411.96 | 454.53 | 411.96 | 454.53 |
| ලංකා සොල්වන්ට්ස් | - | - | 4.62 | 3.72 | 4.62 | 3.72 |
| **එකතුව** | **2,527.55** | **2,513.69** | **2,532.13** | **1,625.06** | **5,059.68** | **4,138.75** |

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

## 2.4 යටිතල පහසුකම් සංවර්ධනය

### 2.4.1 ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

#### අ) මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ගුවන් යානා ඉන්ධන සැපයුම් පද්ධතිය

ආරක්ෂණ ක්‍රමවේදයන්ට අනුව ගුවන්යානා ඉන්ධන සැපයීමේ ප්‍රධාන වගකිව යුතු ආයතනය වශයෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපල වන මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ඉන්ධන සැපයුම් අවශ්‍යතා සපුරාලීම සඳහා ඉහත ව්‍යාපෘතිය ආරම්භ කර ඇත. ව්‍යාපෘතිය පහත සඳහන් ප්‍රධාන සංරචකයන්ගෙන් යුක්ත වේ.

1. ගුවන්යානා පර්යන්තය තුළ ඉන්ධන සැපයුම් පද්ධතිය ඉදිකිරීම.
2. ගුවන්යානා පර්යන්තයෙන් පිටත ඉන්ධන ගබඩා පහසුකම් සහ ඉන්ධන සැපයුම් පද්ධතිය ඉදිකිරීම.
3. ජංගම උපකරණ මිලදී ගැනීම, සේවකයින් සඳහා නිළ නිවාස සහ පහසුකම් ඇති කිරීම.

මෙම ව්‍යාපෘතියේ කටයුතු 2012 ජනවාරි මාසයේ දී ආරම්භ කළ අතර මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 5,400කි. ව්‍යාපෘති කටයුතු ඉටුකිරීම සඳහා පහත සඳහන් අයුරින් කොන්ත්‍රාත් තුනක් ප්‍රදානය කර ඇත.

1 **පැකේජය:** ගුවන්යානා පර්යන්තය තුළ ඉන්ධන සැපයුම් පද්ධතිය ඉදිකිරීම - චයිනා හාබර් ඉන්ජිනියරින් සමාගම මගින්

2 **පැකේජය:** ගුවන් යානා පර්යන්තයෙන් පිටත ඉන්ධන ගබඩා පහසුකම් සහ ඉන්ධන සැපයුම් පද්ධතිය ඉදිකිරීම- අමානා පයිප්ලයින් කන්ස්ට්‍රක්ෂන් එල් එල් සී සමාගම මගින්

3 **පැකේජය:** තුන්වන පාර්ශවයක් විසින් පරීක්ෂා කිරීම සහ සහතික කිරීම - ජ(ර්)මනයිෂර් ලියොඩ් (ප්‍රයිවට් ) ලිමිටඩ් සමාගම මගින්

ඉහත කොන්ත්‍රාත්තු අතරින් 1 සහ 2 පැකේජයන් ඉදිකිරීම් සම්බන්ධ වැඩ කටයුතුවලින් යුක්ත ඒවා වේ. චයිනා හර්බර් ඉන්ජිනියරින් කම්පැනිය මගින් පළමු පැකේජයට අයත් ගුවන්යානා පර්යන්තය තුළ ඉන්ධන සැපයුම් පද්ධතිය ඉදිකිරීමේ කටයුතු, 2013 මාර්තු 18 දින ගුවන්තොටුපලේ මෙහෙයුම් ආරම්භ කිරීමට ප්‍රථම නිම කරන ලදී. මෙම ව්‍යාපෘතිය මුළුමනින්ම නිර්මාණය කිරීම, අභ්‍යන්තර හා බාහිර වශයෙන් පවත්නා පොළව යටින් දිවෙන නළ මාර්ගය ආසන්න වශයෙන් කි.මී. 1.2 ක් දුරක් ඉදිකිරීම, ඉන්ධන සැපයුම් කපාට වලවල් 27ක් ඉදිකිරීම, අංක 5 කපාට වල දක්වා සියළුම යාන්ත්‍රික හා කාර්මික උපකරණ සවිකිරීම් යනාදිය පළමු පැකේජය යටතේ සිදු කරන ලදී.

අමානා පයිප්ලයින් කන්ස්ට්‍රක්ෂන් එල් එල් සී සමාගම විසින් ගුවන්තොටුපලේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමෙන් පසු 2013 මැයි මාසයේ දී ගුවන්යානා පර්යන්තයෙන් පිටත ගුවන්යානා ඉන්ධන සැපයුම් පද්ධතිය ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. එකක් මෙ.ටො. 1,000 ක ධාරිතාවයකින් යුත් ගුවන් යානා ඉන්ධන ගබඩා ටැංකි තුනක් ඉදිකිරීමේ කටයුතු සහ ඉන්ධන සැපයුම් පද්ධතිය ඉදිකිරීමේ කටයුතු මේ වන විට අවසන් අදියරේ පවතී. එම කටයුතු අවසන් වූ වහාම ජ(ර්)මනයිෂර් ලියොඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින් පරීක්ෂා කර බැලීම් ආරම්භ කරනු ඇත. මෙම ඉන්ධන ගබඩා පහසුකම්වල සහ ඉන්ධන සැපයුම් පද්ධතියේ මෙහෙයුම් කටයුතු 2014 මැද භාගයේ දී ආරම්භ කිරීමට නියමිතය.

#### ආ) ලිහිසි තෙල් බැරල් ගබඩා අංගනය

මුතුරාජවෙල ලිහිසි තෙල් බැරල් ගබඩා කිරීමේ හා ඒවා කළමනාකරණය සඳහා කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කරන ලද අතර රු.මිලියන 60ක ඇස්තමේන්තුවකට එම කොන්ත්‍රාත්තුව පිරිනමන ලදී. මෙමගින් ලිහිසි තෙල් බැරල් ආරක්ෂිතව ගබඩා කිරීමේ පහසුකම් ඇති කිරීමත්, ඒවායෙහි මෙහෙයුම් ක්‍රමවත්ව සිදුකිරීමත් අපේක්ෂා කෙරේ.

#### ඇ) තොග ගබඩා පහසුකම්

පිරිපහදු කරන ලද සහ අතරමැදි නිෂ්පාදන ගබඩා කිරීම සඳහා නව ගබඩා පහසුකම් ඇති කිරීමත් පවත්නා පහසුකම් සංවර්ධනය කිරීමටත් ක්‍රියාමාර්ග පිරිපහදුව මගින් ගෙන ඇත. තාර/දැවි තෙල් ගබඩා කිරීම සඳහා මෙ.ටො. 1,600 ක ධාරිතාවයකින් යුත් නව ටැංකියක් ඉදිකිරිමේ කටයුතු ආරම්භ කර ඇත. මීට අමතරව ගුවන් යානා ඉන්ධන ගබඩා කිරීම සඳහා මෙ.ටො. 1,280ක ධාරිතාවයකින් යුත් ටැංකියක් ඉදිකිරිම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීමට ඇණවුම් භාර දී ඇත. එසේම රු. මිලියන 170 ක් වැය කරමින් අංක 01 බොර තෙල් ගබඩා ටැංකිය එහි පතුල සහ පාවෙන ඉපිළුම් තැටිය (Floating Pans) අළුතෙන් මාරු කරමින් අළුත්වැඩියා කරන ලදී.

### (ඇ) පෙට්‍රල් පිරවුම් පහසුකම් ඇති කිරීම

සපුගස්කන්ද පර්යන්තයේ තොග නාස්ති වීමෙන් ඇතිවන පිරිවැය අවම කරමින් මෙහෙයුම් ලාභදායිත්වය වැඩි කිරීමේ අරමුණින් ප්‍රමාණවත් ගබඩා ධාරිතාවයක් සහිතව පෙට්‍රල් පිරවීමේ ගැන්ට්‍රි (Gantry) පහසුකම ඇති කරන ලදී. එසේම, පාවෙන ඉපිළුම් තැටි (Floating Pans) සවි කිරීමෙන් පවත්නා ඩීසල් ගබඩා ටැංකි දෙකද නවීකරණය කරන ලදී. පෙට්‍රල් ගැන්ට්‍රිය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගෙන ඇති අතර මේ වන විට ඒවා සවිකරමින් පවතී.

### 2.4.2 ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

### අ) රසායනාගාරය නවීකරණය කිරීම

ආනයනික පිරිපහදු ඛනිජ තෙල් නිෂ්පාදනවල ගුණත්වය පරීක්ෂා කිරීම සඳහා නවීන තාක්ෂණයෙන් යුක්තව ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ කොලොන්නාව රසායනාගාරය අළුත්වැඩියා කිරීමට යෝජනාකර ඇත. රසායනාගාරය නවීකරණය කිරීමෙන් ඛනිජ තෙල් නිෂ්පාදන ක්‍රමවත්ව පරීක්ෂාකිරීමට හැකිවීම, නිෂ්පාදනවල ගුණාත්මක භාවය පවත්වාගෙන යාමට හැකිවීම, පාරිභෝගික තෘප්තිය හා විශ්වාසය වර්ධනය කර ගැනීමට හැකිවීම සහ රසායනාගාර සේවාව සඳහා ජාත්‍යන්තර තත්ව සහතිකය ලබා ගැනීමට හැකිවීම යනාදිය ප්‍රතිලාභ වශයෙන් ළඟා කරගැනීමට හැකිවේ. මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 300 කි. ගොඩනැගිල්ලේ සැලැස්ම සහ මිල කැඳවුම් යෝජනාව සකස් කිරීම අවසන් කර ඇත. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සමාගම් වලින් මිල කැඳවීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. රසායනාගාර සේවකයින් පුහුණු කිරීම දැනටමත් ආරම්භ කර ඇත. රසායනාගාර ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු 2014 වර්ෂයේ අග භාගයේ දී ආරම්භ කිරීමට නියමිතය.

### ආ) ඒකාබද්ධ තර්ජන කළමනාකරණය (UTM)

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාග මේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වර්ධනය කිරීම සඳහා ඒකාබද්ධ තර්ජන කළමනාකරණ විසඳුම් උපාංග සවි කිරීමට සැලසුම් කරන ලදී. මෙමඟින් තොරතුරු මෙහෙයුම් පද්ධතිය (Server System) සීමිත සහ ව්‍යාප්ත ජාලකරණය (Local and Wide Area Network), අන්තර්ජාල සහ ඊ තැපැල යනාදී තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්වලට ඇති වන අභ්‍යන්තර හා බාහිර තර්ජන කළමනාකරණය කිරීමටත් අපේක්ෂිතය. එබැවින් මෙහි ප්‍රධාන අරමුණ වන්නේ තොරතුරු තාක්ෂණ පද්ධතියට ඇති විය හැකි සයිබර් බලපෑම් සහ අනවසර ඇතුළත්වීම් පසු විපරම් කරමින් පාලනය කිරීමයි. මුළු ඇස්තමේන්තු පිරිවැය රු. මිලියන 12කි.

ඒකාබද්ධ තර්ජන කළමනාකරණ විසඳුම් උපාංග සමාගමේ තොරතුරු තාක්ෂණ අංශයේ සවි කරන ලදී. සත්‍ය වශයෙන් බලපෑමක් වුව හොත් මෙම උපාංගයන් සාර්ථකව ක්‍රියාත්මක වන්නේද යන්න පිළිබඳව පරීක්ෂා කර බැලීම් සිදු කර ඇත. මෙම ව්‍යාපෘතිය 2012 පෙබරවාරි සිට 2013 ජූනි මස දක්වා ක්‍රියාත්මක කර එහි කටයුතු අවසන් කරන ලදී.

### ඇ) ක්‍රියාකාරී නාමාවලිය (Active Directory)

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ දත්ත ඒකකය සඳහා ක්‍රියාකාරී නාමාවලියක් සවි කිරීම මගින් පුළුල් ජාලකරණය (WAN) හා සම්බන්ධ පරිගණක යන්ත්‍රවල ක්‍රියාවලි කලමනාකරණය පහසු කරයි. මෙමඟින් අවම කාලයකින් ස්වයංක්‍රීයව වෛරස් ආරක්ෂණ මෘදුකාංග යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාමටත්, මෙහෙයුම් පද්ධතියේ කාලීනව අවශ්‍ය කොටස් පහසුවෙන් යාවත්කාලීන කිරීමටත්, අවසරලත් පුද්ගලයින්ට පමණක් පරිගණක යන්ත්‍රවල ක්‍රියාකාරීත්වයට ප්‍රවේශවීමටත් හැකියාව ලැබේ. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ අවසර ලත් පුද්ගලයන් දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීම මගින් දත්ත පද්ධතියේ ආරක්ෂාව හා පාලනය තහවුරු කිරීමයි. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 03 කි.

2013 වර්ෂයේ ක්‍රියාකාරී නාමාවලි සැලැස්ම සවි කිරීමේ කටයුතු අවසන් කරන ලද අතර එය ක්‍රියාත්මක තත්වයේ පවතී. මෙය භාවිතය පිළිබඳව සේවකයින් පුහුණු කිරීම සිදු කළ යුතුව පවතී.

### ඈ) ආපදා ප්‍රතිසාධන සැලසුම (Disaster Recovery Site)

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම සහ ලංකා ඉන්දියානු තෙල් සමාගම විසින් සිදු කරනු ලබන මෙහෙයුම් කටයුතුවලදී දත්ත පද්ධතියට ඇතිවිය හැකි බාධාවන් වළක්වා ගැනීම සඳහා ආපදා ප්‍රතිසාධන සැලැස්මක් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. ඉහත ආයතන තුනෙහි මෙහෙයුම් පිරිවැය අවම වන අයුරින් කාර්යක්ෂමව දත්ත කළමනාකරණය කිරීමට හැකි වන පරිදි ආපදා ප්‍රතිසාධන මට්ටමට

පැමිණීම (Recovery Point Objective) සහ ආපදා ප්‍රතිසාධන කාලය (Recovery Time Objective) යන අරමුණු කරා ළඟාවීම සඳහා වැදගත් වේ.

ආපදා ප්‍රතිසාධන මෘදුකාංග සවි කිරීම සඳහා කැමැත්ත ප්‍රකාශ කරන ලද පාර්ශවයන් විස්තරාත්මක යෝජනා කැඳවීම සඳහා තෝරා අවසන් කර ඇත. යෝජනා කැඳවීමේ වාර්තාව ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් සකස් කරමින් පවතී.

## 2.5 ආයතන පරිපාලනය

### 2.5.1 ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය

#### අ) ඛනිජ තෙල් කර්මාන්තය නියාමනය කිරීම

1961 අංක 28 දරණ ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත වර්තමානයට හා අනාගත අවශ්‍යතාවයන්ට ගැලැපෙන අයුරින් නීතිපති දෙපාර්තමේන්තුවේ උපදේශකත්වය මත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය පවතී. තවද, 2002 අංක 33 දරණ ඛනිජ තෙල් නිෂ්පාදන ආශ්‍රිත විශේෂ විධිවිධාන පනත සංශෝධනය කිරීම තුළින් මහජන උපයෝගිතා කොමිෂන් සභාව බලගැන්විය යුතු වේ.

ඉහත පනත් දෙකෙහි සංශෝධිත කෙටුම්පත් නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. අංක 33 දරණ ඛනිජ තෙල් පසුභාග නිෂ්පාදිත ආශ්‍රිත විශේෂ විධිවිධාන පනතේ කෙටුම්පත සඳහා අනුමැතිය 2013.06.30 දින ලැබී ඇත.

මෙම නිර්දේශය සම්බන්ධයෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ යෝජනා / එකඟතාවයන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. ඉහත ආයතන දෙකෙන් යෝජනා/එකඟතාවයන් ලැබුණු පසු නැවත නීතිපති දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කරමින් අවශ්‍ය කටයුතු සිදු කිරීමට නියමිතය.

#### ආ) මනා සම්බන්ධීකරණය

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වේ. මෙම ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම් හා ඉවත් කිරීම් ගරු ඇමති තුමාගේ අනුමැතිය සහිතව අමාත්‍යාංශය විසින් සිදු කරනු ලැබේ. විශේෂයෙන් පිරිස්බල සැලැස්ම සකස් කිරීම හා අනුමැතිය ලබා ගැනීම, බඳවා ගැනීම හා උසස්කිරීම් පටිපාටි සකස්කිරීම සහ අනුමැතිය ලබා ගැනීම, නව තනතුරු ඇති කිරීම, බාහිර බඳවාගැනීම් සම්බන්ධ කටයුතු සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය හා මෙහෙයවීම අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබයි.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නව පිරිස්බල සැලැස්ම සඳහා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ද කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ද අනුමැතිය 2013 ජූලි 17 දින වන විට ලබාගත හැකිවිය.

මෙම කාර්යයන්ට අමතරව කළමනාකරණ කමිටු, විගණන කමිටු, ස්ථාන මාරුවීම් කමිටු, මෙන්ම සියළුම බඳවා ගැනීම් සම්බන්ධයෙන් වන සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සඳහා අමාත්‍යාංශ නියෝජිතයින්ගේ දායකත්වය සපයනු ලබයි. එපමණක්ද නොව, මෙම ආයතනවල සියලුම නිලධාරීන්ගේ විදේශ නිවාඩු සම්බන්ධයෙන් අවශ්‍ය අනුමැතිය ලබා දීම මගින් ද අමාත්‍යාංශය එම ආයතනවල සම්බන්ධීකරණය හා මෙහෙයවීම සිදු කරනු ලබයි.

#### ඇ) පාර්ලිමේන්තු කටයුතු

මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අනුව කටයුතු කිරීමේදී ඇතිවන ගැටළු විසඳීමේදී, විවිධ අණපනත් පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීමේදී, රාජ්‍ය මූල්‍ය පාලනය කිරීමේදී හා රාජ්‍ය පරිපාලන කටයුතු සිදු කිරීමේදී ඇතිවන ගැටළු නිරාකරණය කිරීමේදී ඇති වන හා එම කටයුතුවලදී පාර්ලිමේන්තුව සම්බන්ධවන සියළුම කාර්යයන් මෙම විෂය යටතේ සිදු කරනු ලබයි.

#### ඇ) පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව

ඛනිජ තෙල් කර්මාන්ත කටයුතු පිළිබඳව පාර්ලිමේන්තුව මගින් පත් කරනු ලබන උපදේශක කාරක සභාව ගරු ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගේ සභාපතීත්වයෙන් හා පාර්ලිමේන්තුව මගින් පත් කරනු ලබන මන්ත්‍රීවරුන් 25 දෙනකුගේ සාමාජිකත්වයෙන් සමන්විත වේ.

2013 වර්ෂය තුළදී එක් කාරක සභා රැස්වීමක් පවත්වන ලදී. මෙම රැස්වීමේදී ගරු පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා දෙකක් සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගනිමින් ඒ සම්බන්ධ අදාළ ආයතන සමග සකස් කරන ලද වාර්තා නිසි පරිදි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

| 2.8 වගුව | පෙත්සම් සහ වාචික පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න පිළිබඳ සාරාංශය | | |
|---|---|---|---|
| වර්ෂය | පෙත්සම් - මහජන පෙත්සම් කාරක සභාව | යෝජනා සහ පැමිණිලි පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව | පාර්ලිමේන්තු ප්‍රශ්න |
| 2006 | 07 | 04 | 09 |
| 2007 | 06 | 04 | 07 |
| 2008 | 05 | 01 | 21 |
| 2009 | 02 | 04 | 09 |
| 2010 | 01 | 01 | 07 |
| 2011 | 05 | 06 | 16 |
| 2012 | 00 | 05 | 18 |
| 2013 | 02 | 02 | 17 |
| එකතුව | 28 | 27 | 104 |

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### ඉ) වාචික පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න

පාර්ලිමේන්තුව තුළදී අමාත්‍යාංශ විෂය පථය සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන් විසින් විමසන ප්‍රශ්න සඳහා ගරු අමාත්‍යතුමා විසින් ලබා දෙන වාචික පිළිතුරු හා ඒ සම්බන්ධ පසුබිම් වාර්තා සැපයීම සිදු කරනු ලබයි. 2013 වර්ෂයේදී වාචික පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න 17ක් අසා ඇති අතර අදාළ දිනයේදීම පිළිතුරු ලබා දිය හැකි අයුරින් කිසිදු ප්‍රමාදයකින් තොරව ඒ සඳහා පිළිතුරු හා පසුබිම් වාර්තා ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය සහිතව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.

### ඊ) පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව

ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති ආයතනවල දැනට සේවයේ නියුතු සහ සේවයේ නියුක්තව සිටි නිලධාරීන්ගේ මෙන්ම විවිධ පාරිභෝගිකයන්ගේ පැමිණිලිවලට සහන සැලසීම සඳහා මෙම කමිටුව පත් කර ඇත. පෙත්සම් දෙකක් සඳහා පිළිතුරු මෙම කාරක සභාව වෙත යොමු කරන ලදී.

අමාත්‍යාංශය ආරම්භ කළ දින සිට මහජන පෙත්සම් කාරක සභා සහ උපදේශක කාරක සභා වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් සහ වාචික පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න සම්බන්ධව අමාත්‍යාංශය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගයන්හි සාරාංශ වාර්තාවක් 2.8 වගුව මගින් දැක්වේ.

### උ) ඔම්බුඩ්ස්මන් කාර්යාලය

මහජනතාවගේ ගැටළුවලට සහන සැලසීම සඳහා පාර්ලිමේන්තුවේ ඇති මෙම තනතුර මගින් අනෙක් අමාත්‍යාංශ මෙන්ම ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති ආයතනවලද දැනට සේවයේ නියුතු සහ සේවයේ නියුක්තව සිටි නිලධාරීන්ගේ මෙන්ම විවිධ පාරිභෝගිකයන්ගේ පැමිණිලිවලට සහන සැලසීම සිදු කරයි.

2013 වර්ෂයේ දී අමාත්‍යාංශය වෙත ලද පැමිණිලි දෙකක් සඳහා පිළිතුරු වාර්තා ඔම්බුඩ්ස්මන් කාර්යාලය වෙත යවා ඇත.

### ඌ) නීති හා අධිකරණ කටයුතු

අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්යභාරය ඉටු කිරීමේදී මතුවන ගැටළුවලදී අවශ්‍ය නීතිමය උපදෙස් ලබා ගැනීම, විවිධ පුද්ගලයන්, ආයතන හා සංගම් විසින් මතු කරනු ලබන නීතිමය ගැටළු සම්බන්ධ අධිකරණ කටයුතු සිදු කිරීම හා අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ආයතනවල නිලධාරීන්ට ඇති වන ගැටළු වලට සහන ලබා ගැනීම වෙනුවෙන් ඉදිරිපත් වන නඩු ආදිය සම්බන්ධයෙන් කටයුතු මේ යටතේ සිදු කෙරේ.

මෙම අමාත්‍යාංශය ආරම්භ කරන ලද දිනයේ සිට 2012 දෙසැම්බර් 31 දක්වා අධිකරණයේ නඩු 87ක් සම්බන්ධව කටයුතු සිදු කරන ලදී. අවසන් තීරණය ලබා නොදුන් නඩුවල ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පවතින අතර 2013 වසර තුළදී නඩු 03ක් සම්බන්ධ ඉදිරි කටයුතු කෙරෙමින් පවතී.

### එ) ඩෙංගු මර්දන වැඩසටහන

ශ්‍රී ලංකාව පුරාම සීඝ්‍රයෙන් පැතිරී යන ඩෙංගු උණ රෝගය මර්දනය කිරීම සඳහා රජය ගෙන යන වැඩසටහනට සක්‍රිය දායකත්වයක් ලබා දීමේ අරමුණින් අමාත්‍යාංශ පරිශ්‍රය තුළ හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන දෙකෙහි පරිශ්‍ර තුළ ඩෙංගු මදුරුවන් බෝ වන ස්ථාන හඳුනාගැනීම සහ විනාශ කිරීම මේ යටතේ සිදු කෙරේ.

ඒ සඳහා අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර සහ අනුගමනය කරන විවිධ ක්‍රියාමාර්ග පහතින් දැක්වේ.

- ❖ ඩෙංගු මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ඒවායේ නිසි ක්‍රියාත්මකභාවය පිළිබඳ අඛණ්ඩව අධීක්ෂණය කිරීම සඳහා 2013 වර්ෂයේ දී කමිටුවක් පත් කර ඇත.
- ❖ ඉහත කමිටුව විසින් සෑම සතියකම සිකුරාදා දිනයන්හිදී අමාත්‍යාංශ පරිශ්‍රය තුළ හා ගොඩනැගිලිවල මදුරුවන් බෝ විය හැකි

ස්ථාන පරීක්ෂා කිරීම සහ එම ස්ථාන විනාශ කිරීමට පියවර ගැනීම

- ❖ අමාත්‍යාංශ භූමියේ ඇති සියලුම ගස්වල අනවශ්‍ය අතු මාස 03කට වරක් කපා ඉවත් කිරීමට පියවර ගැනීම
- ❖ අමාත්‍යාංශ ගොඩනැගිලි වටා ඇති කානු පද්ධතිය ජලය නිසි ලෙස බැහැර යන ලෙස අළුත්වැඩියා කිරීම හා ජලය රැඳෙන ස්ථානවලට සතියකට දෙවරක් මදුරුනාශක දියර යෙදීම
- ❖ ඩෙංගු මදුරුවන් විනාශ කිරීම සඳහා අමාත්‍යාංශ පරිශ්‍රය තුළ දුම් ගැස්සවීමට අදාල පියවර ගැනීම
- ❖ ඩෙංගු මදුරුවන් බෝවීම පාලනය කිරීම සඳහා කොළඹ මහනගර සභාවේ සහය ලබා ගැනීම
- ❖ ඩෙංගු උවදුර මර්දනය කිරීම සඳහා මෙම අමාත්‍යාංශය විසින් ගන්නා ලද පියවර මාසිකව සෞඛ්‍ය අමාත්‍යාංශයට වාර්තා කිරීම, අමාත්‍යාංශය යටතේ ඇති ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම යන ආයතනවල මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය කිරීම හා මෙහෙයවීම.

### ඒ) මානව සම්පත් කලමනාකරණය

ගරු අමාත්‍යතුමාගේ, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ හා අමාත්‍යාංශ කාර්යය මණ්ඩලයේ සියලුම ආයතනික හා පරිපාලන කටයුතු විධිමත් අයුරින් කලමනාකරණය කරමින් අමාත්‍යාංශයේ අරමුණු ඉටු කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. මෙම කාර්යය ඉටු කර ගැනීමේදී පහත දක්වා ඇති කාර්යයන් පහත අයුරින් සිදු කරනු ලබයි.

### i. කාර්යය මණ්ඩල බඳවා ගැනීම

ගරු අමාත්‍යතුමාගේ කාර්යය මණ්ඩලයේ සහ අමාත්‍යාංශ කාර්යය මණ්ඩලයේ බඳවා ගැනීම්, සේවය අවසන් කිරීම්, බඳවා ගැනීමේ පරිපාටි සකස් කිරීම්, කාර්ය මණ්ඩල පෞද්ගලික ලිපි ගොනු පවත්වාගෙන යාම හා අභ්‍යන්තර අනුයුක්ත කිරීම් හා ස්ථාන මාරු කටයුතු මෙම විෂය යටතේ සිදු කෙරේ.

පුරප්පාඩුව පැවති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංවර්ධන) තනතුර සඳහා නිලධාරියෙකු පත් කර ගන්නා ලද අතර නීති නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සිදු කෙරෙමින් පවතී. 2013 වර්ෂය තුළදී සංවර්ධන නිලධාරී තනතුරු 05ක් ඇති කරන ලද අතර එම තනතුරු සඳහා අදාල ආයතනවල අනුමැතියද ලබා ගන්නා ලදී. එසේම ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම සඳහා වෙනම අංශයක් අමාත්‍යාංශය තුළ පිහිටුවනු ලැබූ අතර එම අංශය සඳහා අතිරේක ලේකම්වරයෙකු, අධ්‍යක්ෂවරයෙකු සහ සහකාර අධ්‍යක්ෂවරයෙකු බඳවා ගැනීම සඳහා තනතුරු ඇති කිරීමට හැකි විය.

### ii. සුභ සාධන කටයුතු

කාර්යය මණ්ඩලයේ විශ්‍රාම වැටුප් හිමි නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් සම්බන්ධ කටයුතු, රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදල් සම්බන්ධ කටයුතු, අතිකාල දීමනා, ගමන් වියදම් දීමනා, අනෙකුත් විශේෂ දීමනා, නිදහස් දුම්රිය බලපත්‍ර, දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර, සහනදායී පොළිය මත ණය ලබා දීම ආදී කටයුතු මෙම විෂය යටතේ සිදු කරනු ලැබේ.

2013 වර්ෂය තුළදී විශ්‍රාම ගිය අමාත්‍යාංශ කාර්යය මණ්ඩල නිලධාරීන් 03 දෙනකු ගේ විශ්‍රාම වැටුප් සම්බන්ධ කටයුතු සිදු කර ඇත. දුම්රිය ප්‍රවාහන මාධ්‍යය ලෙස භාවිතා කරන නිලධාරීන් 18 දෙනකු සඳහා දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර 200ක් ලබා දී ඇති අතර නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර 16ක්ද නිකුත් කර ඇත. නිලධාරීන්ගේ විවිධ වූ අවශ්‍යතා සපුරා ගැනීමට විශේෂ අත්තිකාරම් වශයෙන් රු. 87,500.00ක්ද උත්සව අත්තිකාරම් වශයෙන් රු. 300,000.00ක්ද, ආපදා ණය වශයෙන් රු. 2,792,423.00ක්ද දේපළ ණය වශයෙන් 1,143,404.00ක්ද 2013 වර්ෂයේදී ලබා දීමට අවශ්‍ය අනුමැතිය ලබා දී ඇත.

දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන හා ප්‍රදර්ශනය වසරක් ඇතුළත රජය විසින් දිවයින පුරාම සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරනු ලබන අතරතුර එම වසරේදීම තෝරා ගත් ප්‍රදේශයක හෝ ප්‍රදේශ කිහිපයකම ආර්ථික සමාජීය සංස්කෘතික ආදී අංශවල සීඝ්‍ර සංවර්ධනයක් ඇති කිරීම හා රාජ්‍ය ආයතනවල ක්‍රියාකාරිත්වය පිළිබඳව සාමාන්‍ය ජනතාවට අවබෝධයක් ලබා දීම අරමුණු කර ගනිමින් දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන හා ප්‍රදර්ශනය රජය විසින් දියත් කර ඇති ඉලක්ක ගත වර්ෂය තුළ තෝරා ගත් ප්‍රදේශයේ භෞතික සම්පත්වල පවතින අඩුපාඩු එම විෂය භාර රාජ්‍ය ආයතනය මගින් ඉටු කර දීම, රාජ්‍ය ආයතන සම්බන්ධ කර ගනිමින් විවිධ උපාය මාර්ග තුළින් ප්‍රදේශයේ ජීවත් වන සාමාන්‍ය ජනතාවගේ සමාජ ආර්ථික ගැටළු අවම කර දීම හා ජනතාවගේ ආගමික, සංස්කෘතික ප්‍රබෝධයක් ඇති කිරීමට දායක වීම ආදී කාර්යයන් සිදු කිරීම මෙම වැඩසටහන තුළින් බලාපොරොත්තු වේ. 2013 වර්ෂයේදී පවත්වන ලද දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන හා ප්‍රදර්ශනය සඳහා තෝරා

ගනු ලැබූ ප්‍රදේශයේ ආර්ථික සමාජීය සංස්කෘතික ආදී අංශ සංවර්ධනයට ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන වන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් මහගු දායකත්වයක් සපයා ඇත.

### iii. නිලධාරීන්ගේ හැකියා වර්ධනය

දැනුම, හැකියාව හා ආකල්ප වර්ධනය තුළින් වඩා ඵලදායී සහ කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ඇති කිරීමට විවිධ පුහුණු වැඩසටහන්වලට සහභාගීවීමට කාර්යය මණ්ඩලයට අවස්ථාව ලබා දෙන ලදී.

**2.9 වගුව — අමාත්‍යාංශය විසින් ලබා දෙන ලද පුහුණු වැඩසටහන් - 2013**

